2026.08.11 වන දින සාමාන්‍ය රැස්වීම් වාර්තාව.
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 අගෝස්තු මස 11 වන දින පෙ.ව 9.30 ට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇහැලියගොඩ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාවයි.

සහභාගීත්වය:-

01.ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

02. ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා

03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. එච්. එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා

04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා

05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා

06.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා

07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා

08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය

09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය

10.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී. ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා

11.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ. සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා

12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා

13.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා

14.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා

15.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය

16.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා

17. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය

18.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා

19.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එල්. ජයසේකර මැතිතුමා

20.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා

21.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා

22.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා

23.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා

24.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය

25.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා

26.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා

27.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

28.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී පී. ඒ. කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය

29.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා

30.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා

31.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. පී.ජේ.පී.හිරිපිටිය මැතිතුම

32. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා

33.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්. ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා

34.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිනිය

නොපැමිණීම්

01. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා.

කාර්ය මණ්ඩලය

01. ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා - ලේකම්

02. ජී.අයි.කේ.ජයතුංග මිය - සංවර්ධන නිලධාරී

03. සී.චන්දිමා ප්‍රියදර්ශනී මිය - සෞඛ්‍ය කම්කරු

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් පැමිණ සිටි උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීරුන්, මන්ත්‍රීවරියන්, මාධ්‍යවේදීන්, සභා ලේකම් හා කාර්යාලයේ නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

(අ) 2026.07.14 වන දින පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

2026.07.14 වන දින වාරතාවේ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අජන්ත වික්‍රමසිංහ මන්ත්‍රීතුමාගේ සිද්ධියක් සම්බන්ධ ලිපියක් සියලුදෙනාගේ අත්සන් සහිතව ඉදිරිපත් කළ ලිපික් ඉදිරිපත් වී නොමැති බවත්, එම තොරතුරු ඉදිරිපත් කිරීමේදී වාර්තාවේ කිසිදු ස්ථානයක නමක් සඳහන් නොවන බවත් එම සිද්ධිය කියා එහි සඳහන්ව ඇති බවත් , එහිදී ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් සිදු කළ ප්‍රකාශය සම්බන්ධයෙන්ද කිසිදු සටහනක් නොමැති බවත්, එම වාර්තාවේ සභාවෙන් පිටවූ බව සඳහන් වුවද පැමිණි වේලාවක් සඳහන් නොවන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියවිසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

මන්ත්‍රීතුමියනි, එය වර්තාගත කළ නොහැකි බවත්, එය යෝජනාවක් නොව පෙත්සමක් බවත්, එම නිසා 2026.07.14 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාවට ඇතුළත් නොකළ නොහැකි බවත්, ඇතුළත් කළහොත් එය රීති ප්‍රශ්නයක් වන බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමාවිසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

විශේෂ යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමට යොමු කළ ද ගරු සභාපතිතුමන් විසින් එය පසුව ඉදිරිපත් කිරීම මෙයට හේතු වූ බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියවිසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

අවුරුද්දකුත් මාස තුනක කාලයක සිට සභාව පවත්වාගෙන යනු ලබන බවත්, සභාව විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පළාත් සභාවෙන් නීති මාලාවක් ලබාදී ඇති බවත්, එහි මහජන පැමිණිලි පෙත්සම්, කල්දී ඇති යෝජනා, යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න පිළිබඳව එහි සඳහන් වන බවත්, රීති ලෙස විශාල ලේඛනයක් තිබුණද අපගේ මන්ත්‍රීතුමන්ලා කිසිවෙක් වත් තමන්වත් දෙතුන්පාරක් කියවා බැලුවද සියල්ල අවබෝධ කර ගෙන නොමැති බවත්, අදහසක් ලෙස තමන් විසින් පවසා සිටින්නේ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහා සභා රීති පිළිබඳව ,සභා කටයුතු සම්බන්ධව විධිමත් පුහුණුවක් නැවතත් අවශ්‍ය බවද නොමැතිනම් සභාවේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් දක්ෂ ලේකම්වරයෙක් පැමිණ සිටින බවත්, සභාවේ පරිපාලන කටයුතු හොඳින් සිදු වන බවත්, ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් සමඟින් ගැටුම් ඇති වන බවත් සඳහන් කරන ලදී.පෙත්සමක් ලබාදී වාර්තාවට ඉදිරිපත් කරන ලෙස පැවසුවහොත් එය ගැටළුවක් වන බවත් එබැවින්

ඒ සම්බන්ධයෙන් නිසි අවබෝධයක් ලබාදීම සුදුසු බව තමන් සිතන බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

උපාය මාර්ගික වැඩපිළිවෙල සම්බන්ධ පුහුණු වැඩමුළුවක් සඳහා තමන් පසුගිය දිනක සහභාගී වූ බවත් එහිදී හිටපු කොමසාරිස්වරයෙක් පැවසූ පරිදි සභා වාර්තාවේ ඇතුලත් විය යුත්තේ ගරු මන්ත්‍රීතුමන්ලා සිදු කළ කතාවන් නොව එදින ලබාගත් තීරණ පමණක් බවත්, ඒ පිළිබඳව තමන් විසින් ප්‍රකාශ කරනවාට වඩා එතුමා ගෙන්වාගෙන පුහුණු සැසියක් සිදුකිරීම වැදගත් බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභා වාර්තාවක් පිටු හතර පහකින් අවසන් විය යුතු බව එහි දී සඳහන් කළ බවත්, කතා කරන සියල්ලක්ම සභා වාර්තාවේ ඇතුළත් නොවිය යුතු බව පැවසූ බවත්, පනතෙහි වගන්තිය දක්වමින් එතුමා එය සඳහන් කළ බවත්, එහි සිදු වන්නේ වාර්තා කිරීම පමණක් බව ද, තව වසර තුනක් කටයුතු කළ යුතු බවත්, සභාවක් ලෙස සබරගමුව පළාතේ ඉතාමත් පහළ ස්ථානයක අප සිටින බවත් ගරු සභාපතිතුමාගේ නායකත්වයෙන් මෙම සභාව ඉදිරියට රැගෙන යාමට සභා කටයුතු සම්බන්ධයෙන් පුහුණුවක් අවශ්‍ය බවත් වාර්ෂික පුහුණු සැලැස්මට ද එය ඇතුළත් කර ඇති බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ගරු උපසභාපතිතුමාද සඳහන් කළ පරිදි ඉහළ නිලධාරියෙක් ගෙන්වා පුහුණු සැසියක් පැවැත්වීම සිදු කරමු යැයි ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. හැන්සාඩ් ලෙස සභා වාර්තාව නොලියවන බව වත්මන් ලේකම්තුමාද සඳහන් කළ බවත්, ප්‍රකාශ කරන කරුණ පමණක් ඇතුළත් වීම ප්‍රමාණවත් බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා**.**

පනතේ තිබෙන්නේ ප්‍රාදේශිය සභාවක සියලු කාර්ය කටයුතු, තීරණ, නියමයන් සහ ක්‍රියා වාර්තා කළ යුතුයි කියා බවත්, ඒ නිසා තීන්දු තීරණ පමණක් නොව සියලුම කාර්යන් හා කාර්ය කටයුතු. ඒ අනුව එය නිර්වචනය කර ගත යුතු බවත්, ඒ අනුව කාර්ය කටයුතු හා තීන්දු තීරණ මොනවාද යන්න සභාව විසින් තීරණය කළ යුතු බවත්, තීන්දු තිරණ පිළිබඳව පැහැදිලි බවත්, කාර්ය කටයුතු මොනවාද යන්න පැහැදිලි කර ගත යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් 2026.07.14 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

2026.07.14 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් චික්‍රමසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2026.07.14 වන දින පවත්වන ලද සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන. - කිසිවක් නැත.

(ඇ) සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා අසනීප වීම නිසා 2026-08.11 වන දින මහා සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ලිපියක් යොමුකර තිබෙන බවත්, එම ලිපි මේ මොහොතේ සභාගත කරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.

අසනීප වීම නිසා 2026-08.11 වන දින සාමාන්‍ය සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා නිවාඩු ඉල්ලා ඇති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා සඳහා නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

2026.08.11 වන දින සාමාන්‍ය සභා රැස්වීමට පැමිණිය නොහැකි බව දන්වා නිවාඩු ඉල්ලා ඇති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා වෙත නිවාඩු අනුමත කිරීමේ යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම සඳහා අනුමතිය ලබා දෙන ලදී.

(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම. - කිසිවක් නැත.

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න. - කිසිවක් නැත.

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා පෙ.ව 09.49 ට සභාවට පැමිණෙන ලදී.

01 (i) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

පළාත් පාලන කොමසාරිස්ගේ පළාත් පාලන ආයතන සතු නිශ්චල දේපළ බදු ලබා දීමට අදාළව නිකුත් කළ 1/2023 චක්‍රලේඛයේ ඇතුළත් ගිවිසුමේ අංක 13 වන වගන්තිය වන පරිශ්‍රයෙහි රුපියල්..... ක වටිනාකම ඉක්මවන අලුත්වැඩියාවත් බදු දීමනාකරු විසින් ද රුපියල් ..... හෝ ඊට අඩු වටිනාකම් ඇති අලුත්වැඩියාවන් බදුදීමනාකරුගේ එකඟතාවය ඇතිව බදුගැනුම්කරු විසින් කළ යුතු ය වශයෙන් සඳහන්ව ඇත.එබැවින් එහි බදුගැනුම්කරු විසින් සිදු කරවා ගත යුතු අලුත්වැඩියා වටිනාකම රුපියල් 50,000.00 ක් ලෙස ඇතුළත් කළ යුතු බවට 2026.06.26 දිනැති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී තීරණය කරන ලදී.
ඒ අනුව අදාළ ගිවිසුමේ බදුගැනුම්කරු විසින් සිදු කළ යුතු අලුත්වැඩියා වටිනාකම රුපියල් 50,000.00 ලෙස ගිවිසුමට ඇතුළත් කිරීමට සුදුසු බව යෝජනා කරමි.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෙම ගිවිසුමේ හිස්තැනින් දක්වා ඇති ස්ථාන දෙක සඳහා කිසිදු මුදලක් සඳහන් කර නොමැති බැවින් එම හිස්තැන් දෙක සඳහා රුපියල් 50,000.00 මුදලක් යෙදීම සුදුසු බව මේ යෝජනා වෙන් සිදු කරන බවත්,රුපියල් 50,000.00 අඩු අලුත්වැඩියා වියදම් ගැණුම්කරු විසින් සිදු කළ යුතු බවත්, රුපියල් 50,000.00 වැඩි අලුත්වැඩියා වියදම් සභාවෙන් දැරිය යුතු බව මෙම යෝජනාවෙන් යෝජනා කරන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

01 (ii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැළියගොඩ වෙළඳ සංකීර්ණය බිම් මහල අංක 07 කඩකාමර බදුකරු වන ඒ.ඒ.කොඩිප්පිලි මයා 2008.01.18 වන දින මිය ගොස් ඇති බැවින් අදාළ කඩ කාමරය සඳහා හිමිකම්පාන සියලු පාර්ශවයන් පැවරීම සඳහා එකඟත්වය ප්‍රකාශ කර ඇති බැවින්, ඔහුගේ මිණිබිරිය වන විශ්මි නවෝදාා අබේසිංහ කොඩිප්පිලි වෙත එම කඩකාමරය පැවරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 09.52 ට සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

02 (i) යොජනාව සඳහා මන්ත්‍රීවරු දෙදෙනෙකු විසින් යෝජනා භාර දී තිබු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමාට දින තුනකට පෙර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා මෙම යෝජනාව ඉදිරිපත් කර තිබු බැවින්, යෝජනා ලබා දීමේ පිළිවෙල සැලකිල්ලට ගෙන ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමාගේ යෝජනාව ඇතුළත් කිරීමට කටයුතු කළ බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

02 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

යායපාර මහේෂ් මහතාගේ නිවස අසල අඩක් නිමකළ මාර්ගය මීටර් 20 ක් පමණ කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

මෙම මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කර ඇති බවත්, නමුත් මීටර් 20 ක පමණ ප්‍රමාණයක් කොන්ක්‍රීට් කිරීමට ඉතිරිව තිබෙන බවත්, . වර්ෂාවෙන් පසු මාර්ගය භාවිතා කළ නොහැකි තත්වයේ පවතින බවත්, මේවන විටද එහි ගමන් කළ නොහැකි තත්ත්වයක් ඇති බවත්, දෙපැත්තම කොන්ක්‍රීට් යෙදූ පසු මැද වගුරු බිමක් බවට පත්වන බැවින් කඩිනමින් මෙය නිමකර දෙන ලෙස ඉල්ලීමක් සිදුකරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමාවිසින් ප්‍රකාශ කරන ලදී.

තමන් විසින් යෝජනා තුනක් ඉදිරිපත් කළ ඇති බවත් එම යෝජනා තුන මෙම වසරේ අප්‍රේල් මාසයේ න්‍යාය පත්‍රයට ඇතුලත් කල යෝජනා දෙකක්ද සමඟ ඇතුළත් කර ඇති බවත්, ගියවර සභා රැස්වීමේ දී යෝජනා පිළිබඳව සාකච්ඡා කිරීමේදී යෝජනා තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමන් පැවසූ බවත්, ඒ අනුව එම යෝජනා ඉදිරිපත් කළ බවත්, ඒකාබද්ධ කාරක සභා රැස්වීමක් පවත්වා ලක්ෂ 24 ක් ලබාදෙන බව පැවසුවත් එය ලබා නොදුන් බවත්, ගරු සභාපතිතුමාගේ වචනයෙන්ම මැයි මස 12 වන දින සභාවේදී 17 වන පිටුවේ සලදහන් පරිදි ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර ඇත්තේ යෝජනා සියලුදෙනාටම ඉදිරිපත් කළ හැකි බවත්, එම නිසා යෝජනා ඉදිරිපත් කළ බවත්, තමන් විසින් ඉදිරිපත් කළ යෝජනා ගරු සභාපතිතුමන් විසින් ඉවත් නොකළ බව තමන් දන්නා බවත්, ගරු සභාපතිතුමා බොරු නොකියන බවට ලොකු විශ්වාසයක් ඇති බවත්, තමන් විසින් ඉදිරිපත් කළ තුන්වන යෝජනාව කපා ඉවත් කළ අය විසින් එය කියවා බැලීමක්ද සිදුකර නොමැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව හතරවෙනි මාසයේදීද ඉදිරිපත් කළ විට කපා ඉවත් කළ බවත්, මෙම අවස්ථාවේදී ද කපා ඉවත් කර ඇති බවත් එහි සඳහන්ව ඇත්තේ ලබුගම හා කලටුවාව ජලප්‍රවාහන මණ්ඩලයට ලියුමක් ඉදිරිපත් කර ඉල්ලීමක් සිදු කරන ලෙසට බවත්, එසේ ඉවත්කර ඇත්තේ ගරු සභාපතිතුමා නොව වෙනත් අදෘශ්‍යමාන බලවේගයක් විසින් බවත්, එසේ සිදු නොකරන ලෙසටත් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බවත්, මැයි සහ ජුනි මස වාර්තාවල සඳහන්ව ඇත්තේ යෝජනා ඉදිරිපත් කරන ලෙසට බවත්, ඒ අනුව යෝජනා ඉවත් නොකරන ලෙසට ඉල්ලීමක් කරන බවද,නොමැති නම් සියලු දෙනාම කැඳවා එම යෝජනා ඉදිරිපත් නොකරන ලෙසට දැනුම්දෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

යෝජනාව ප්‍රතිෂේප කළ හේතුව ලිපියේ සඳහන් නොවන්නේද යන්න ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

එසේ යෝජනාව ප්‍රතික්ෂේප වීමට හේතුව ලෙස සඳහන්ව ඇත්තේ “අංක 2 හා 3 යටතේ ඉදිරිපත් කර ඇති සංවර්ධන යෝජනාව, 2026 වර්ෂය සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන ඉක්මවා ඇති බැවින් 2026.08.11 වන දින සභා රැස්වීම් න්‍යාය පත්‍රය සඳහා ඇතුළත් කළ නොහැකි බව කාරුණිකව දන්වමි” යනුවෙන් බවත් එය පිළිගත හැකි බවත්,

එහි සඳහන්ව ඇති තුන්වන යෝජනාව සඳහා මුදල් වැය නොවන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

3 යෝජනාවෙන් ඉදිරිපත් කළ යෝජනාව කුමක් ද යන්න ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

මෙම යෝජනාව කපා හරින විට සභාපතිතුමාගේ අත්සනින් ලිපිය පැමිණියත්, ගරු සභාපතිතුමා මෙය කියවා නොමැති බවත්,එතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
එහි සඳහන්ව ඇත්තේ ලබුගම හා කලටුවාව ජලාශ අංක 139 ග්‍රාම නිලධාරී වසමට අයත් පවුල් ඒකක 20 ක පමණ ජනතාවට පානීය ජලය ලබාදීමට කටයුතු කරන ලෙසට යෝජනා කරමි යනුවෙන් බවත්, මෙය සභාවෙන් කළ නොහැකි බව තමන් දන්නා බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
පවුල් 20 ක් නොව පවුල් 200 ලෙස සටහන්ව තිබූ බව තමන්ට මතක බවත්, එම නිසා නැවත යෝජනාව ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

පවුල් 200 ක් ලෙස සටහන් වී ඇත්තේ තමාගේ අතපසු වීමකින් බවත්, ඒ සම්බන්ධව සමාව ඉල්ල සිටින බවත්, මෙය සභාවෙන් කළ නොහැකි කාරණාවක් බවත්, එහෙත් ජලසම්පාදන මණ්ඩලයට ඉල්ලීමක් කිරීමට හැකි බවත්, මෙය සභාපතිතුමා කියවා නොමැති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

තමන් විසින් යෝජනාව කියවා බැලූ බවත්, ජල සම්පාදන මණ්ඩලයට යොමු කරන ලෙස යෝජනාවේ ඇතුළත් කිරීමට කටයුතු කළා නම් එය ප්‍රතිෂේප නොකරන බවත්, පවුල් 200 කට සභාවෙන් ජලය සැපයීම කළ නොහැකි නිසා ප්‍රතිෂේප කළ බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

තමන් අනිත් යෝජනාව ලෙස යකුදාගොඩ තුෂර මුදලාලි මහතාගේ කඩේ අසලින් ඇති මාර්ගය මීටර් 30 ක් පමණ සුදුසු පරිදි සංවර්ධනය කිරීමට යෝජනා කරමි. මෙම මාර්ගය තමාගෙවත්, තමාගේ ඥාතියෙකුගේවත් නොවන බවත්,මෙවර සමුපකාර මැතිවරණය සඳහා ජාතික ජනබලවේග ආණ්ඩුවේ රැස්වීම් පැවැත්වූ සමරසිංහ මහතාගේ නිවසට ගමන් ගන්නා මාර්ගය බවත්, එම පුද්ගලයාට අසාධාරණයක් සිදු නොකරන ලෙසත්, එම මීටර් 30 ක පමණ කොටස සකස් කර දෙන ලෙසට ඉල්ලීමක් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

2026 අය වැය ප්‍රතිපාදන ඉතා සුළු ප්‍රමාණයක් පමණක් පවතින බවත්, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව වැඩි මුදලක් යෙදවීම සිදු වන යෝජනා ප්‍රතිෂේප කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

03.(i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. සමන්සිරි විජේසිංහ මැතිතුමා.

විලේගොඩ බොපැත්ත පාර ජයසේන මහතාගේ නිවස අසලින් පහළට යන කාණු පද්ධතිය සකස් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.

මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට විශේෂිතම හේතුව වන්නේ,විමධ්‍යගත අරමුදලින් බෝපැත්ත මාර්ගයේ කාණු පද්ධතියක් සැකසුව ද එහි බොක්කුව එල් හැඩයට පවතින බැවින්, එම බෝක්කුව හාරා බැලූ විට වතුර බැස්සීමට අසීරු තත්වයක් පෙනී ගිය බවත්, වතුර බැස්වීමට නොහැකි වුවහොත් කළ සංවර්ධන යෝජනාවෙන් ද ප්‍රයෝජනයක් නොමැති වන බවත්, ප්‍රකාශ කරන ලදී. නමුත් බොක්කුව කැඩීමටද නොහැකි බවත් එය පළාත් සභා ප්‍රතිපාදන මඟින් සැකසූ බෝක්කුවක් බවත්, පාරේ ගමන් කරන ජනතාව ස සමඟ ද කතාකර බෝක්කුව හැඩකර පහළට තවත් හියුම් පයිප්පයක් යොදා කාණුව සකසා ගතහොත් එම කාර්ය පිළිළෙකට සිදු කර ගැනීමට හැකි බැවින් මෙම ඉල්ලීම තමන් සිදුකල බවද මෙම වසරේ එය ඉක්මනින් සිදුකර දෙන ලෙසටද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මේ සම්බන්ධයෙන් තමන් නිවැරදි කිරීමක් ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ යෝජනාවක් පරිදි එම ස්ථානයේ කාණු පද්ධතිය සැකසූ බවත්, එහි තිබූ පොඩි පොඩි අඩුපාඩු තමන් විසින් එතුමන් හට දැනුම් දුන් බවද, ව්‍යාපෘතියක් සිදු කිරීමේදී ප්‍රදේශයේ සිටින ජනතාව දැනුවත් කළ යුතු බවද එසේ දැනුවත් කිරීමේ විදි කිහිපයක් ඇති බවත්, එම අවස්ථාවේදි තමන් විශ්වාස කරනා ලෙස පොදු පිළිගැනීමක් ලෙස දැනුම් දිය හැකි ආකාරය දැන්වීමක් දැමීම බවත්,.එසේ දැන්වීමක් යොදා නොතිබූ බවද ඒ අනුව තමන් විසින් ගරු මන්ත්‍රීතුමාට කතා කර පවසා සිටියේ මෙවන් ඉදිකිරීමක් සිදුකරන බව ජනතාව නොදැනුවත් බවත්, මෙම කාණුව කපන බව ජනතාව නොදන්නා බවත් සතියක් පමණ වාහන පිටතට ගැනීමට නොහැකි තත්වයක් පැවතුණ බවත් එම දැනුම්දීම නොලැබූ කිහිප දෙනෙක් තමන් අමතා මෙලෙස තත්වයක් උද්ගතව ඇති බව පවසා ඒ පිළිබඳව මැදිහත් වන ලෙස පැවසූ බවද ඒ අනුව තමන් ක්‍රියාකල බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමන් එලෙස කතා කිරීමේදී වැරදි මතයක් සමාජගත වී ඇති බවත්, තමන් එම ව්‍යාපෘතිය කඩාකප්පල් කිරීම සඳහා එලෙස කතා කර ඇති බව තැන් කිහිපයකින් ආරංචි වූ බවත් එලෙස කට කතාවක් යාම පිළිබඳව තමන් නොසලකා හරින බවත් තමන් පවසා සිටින්නේ එම ව්‍යාපෘතිය සිදුකරන ක්‍රියාකාරී ආයතනය හෝ ව්‍යාපෘතිය සිදු කරන කොන්ත්‍රාත්කරුගේ හෝ වැඩ බලන නිලධාරීන්ගේ ගැටළුවක් බවත් එය ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ ගැටළුවක් නොවන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඔවුන් මෙම ව්‍යාපෘතිය පිළිබඳව කල්තියා ජනතාව දැනුවත් කිරීම සිදු කළ යුතු බවත් එය සම්ප්‍රදාය බවත් එසේ සිදුවී නොතිබූ බවත් මන්ත්‍රීතුමන්ලා ලෙස දෝෂයක් පෙන්වා දුන් පසු එය වැරදි ලෙස සමාජගත කිරීම සිදු නොකළ යුතු බවත් එම ව්‍යාපෘතියට තමන් කිසිසේත් විරුද්ධ නොවන බවත් එය ඉතාමත් හොඳ ව්‍යාපෘතියක් බවත් අඩුපාඩු පෙන්වා දීමේදී වැරදි මතයක් සමාජගත වී ඇත්නම් එය නිවැරදි කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

මෙම ව්‍යාපෘතිය බෝපැත්ත පාරේ සිදු විය යුතු ම ව්‍යාපෘතියක් බවත්, එහි අඩුපාඩු කිහිපයක් තිබූ බවත් තමන් විසින් ඒ සඳහා මැදිහත්වීමක් සිදු නොවූයේ තමන් ඒ සඳහා අකුල් හෙලනවාය කියා මතයක් සමාජගත වේ යැයි සිතා බවත්, මේවන විට ව්‍යාපාතිය අවසන් නිසා ඒඉ සඳහා මැදිහත් වීමට තීන්දු කළ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

එහි දැල් ආවරණයක් යොදා ඇති බවත්, එම දැල් ආවරණය නිසා මගීන්ට හා වාහන වලට හානි සිදුවිය හැකි බවත් තාක්ෂණික නිලධාරී මැදිහත්ව එම කාර්යය සිදු කළ යුතු බවත්, වාහනයක් එම ස්ථානයෙන් හරවා ගැනීමේදී ටයර් වලට හානි සිදුවිය හැකි බවත් දැනට සපත්තු කාණුවේ කොටස වසා මිනිසුන් භාවිතයට ගන්නා බවත් එම මුදල් ප්‍රතිපාදනවල වටිනාකම නිවැරදි ලෙස ලබා ගැනීමට නොහැකි වී ඇති බවත් එම නිසා ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේදයක් උපයෝගී කරගෙන එම ප්‍රතිපාදන වෙන්කරවාගෙන සෑදූ දෙයෙහි වටිනාකම නිවැරදි ලෙස භාවිත කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

සමන්සිරි මන්ත්‍රීතුමාගේ යෝජනාව අත්‍යවශ්‍ය යෝජනාවක් බවත් එම ව්‍යාපෘතිය අවසන් වීමේදී ජයසේන මහතාට විශාලතම හානිය සිදුවී ඇති බවත් එම ඉඩමට වතුර පාර එම ස්ථානයෙන් ගමන් කිරීම විශාල හානියක් බවත් සමන්සිරි මන්ත්‍රීතුමාගේ මැදිහත්වීමෙන් සිදුකරන එම යෝජනාව සඳහා හැකි ඉක්මනින් ප්‍රතිපාදනයක් වෙන්කර හැකි ඉක්මනින් එම කටයුත්ත සිදු නොකරන්නේ නම් තවත් අතුරු ප්‍රශ්න ඇති විය හැකි බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම කොන්ත්‍රාත්කරු තමන් පෞද්ගලිකව දන්නා අයෙක් බැවින් කිසිවක් නොකියූ බව ද තමන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාට ද කතා නොකළ බවද තමන් විසින් කොන්ත්‍රාත්කරුගෙන් අසා සිටියේ එම ස්ථානයේ සිටින්නේ වෛද්‍යවරුන්,පෞද්ගලික ආයතනවල රැකියා කරන්නන් සිටින බැවින් මෙම කාර්ය සිදු කිරීමට දින කිහිපයක් ගතවනවාද යන්න පිළිබඳව විමසූ බවයි. වෛද්‍යවරුන්ට රෝහල්වල නේවාසිකාගාරවල නවාතැන් ගන්නා ලෙස කොන්ත්තාත්කරු විසින් පවසා සිටි බවත්, තමන්ට සිදු කළ එම ප්‍රකාශ සම්බන්ධයෙන් එම කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කළ යුතු බවත් සත්‍ය වශයෙන්ම එම ව්‍යාපෘතිය හොඳම ව්‍යාපෘතියක් බවත් විශාලතම ගැටළු සහගත ව්‍යාපෘතිය බවත් එම ව්‍යාපෘතියට මැදිහත්වීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ට නැවතත් ස්තුතිවන්ත වන බවත් ඉතිරි කොටස ක්‍රමානුකූලව නිම කිරීම සඳහාද මැදිහත් වන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගෙන් ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. සමන්සිරි විජේසිංහ මැතිතුමා.

ව්‍යාපෘතියේ අඩුපාඩු පෙන්වා දීම පිළිබඳව මන්ත්‍රිවරුන් දෙපළට ස්තුතිවන්ත වන බවත්, මේ සඳහා යොදා තිබෙන සපත්තු කාණුව ගැඹුර වැඩි බව තාක්ෂණ නිලධාරීන් පැවසූ බවත් එයද සාදා දෙන බවත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර මුදල් ගෙවා අවසන් කර නොමැති බවත් එම පාර කෙලින් සැදුව හොත් තාප්පය කඩීමට සිදුවන බවත් මිනිසුන් සමඟ ගැටළු ඇති කර ගත නොහැකි නිසා එය හරහට යොදා ඇති බවත්, ඒ නිසා දිග ප්‍රමාණය වැඩි වී ඇති බවත්, ගැටළුව ඇති වී තිබෙන්නේ හිරිපිටිය මහතාගේ නිවසට යන මාර්ගයේ සපත්තු කාණුවේ ගැඹුර වැඩිවීම බවත් කොන්ත්‍රාත්කරු සමඟද සාකච්ඡා කර අවසානයේ යකඩ එල්වයරින් එකක් ද සකසා එයින් වාහනවලට වන හානිය හා කාණුවේ ගැඹුර අඩු කිරීමට කොන්ක්‍රීට් ලැල්ලක් හෝ යොදා වැඩ අවසන් කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

බෝපැත්ත සිට ඇහැලියගොඩට පැමිණෙන විට එම මාර්ගයේ කාණු පද්ධතියක් නොමැති නිසා වැසි ජලය පිරී තිබෙන බැවින් එහි කාණු පද්ධතිය සකස් කර දෙන ලෙස මීට පෙර කිහිප වතාවකදීම තමන් ද ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා ඇති බවත් එම ව්‍යාපෘතිය මේ වන විට ආරම්භ කර ඇති බවත් ඒ පිළිබඳව පළමු ගරු සභාපතිතුමන්ගෙට ස්තුතිවන්ත වන බවත් ටික දුරකට එම කටයුතු සිදුකර නවතා නොදමා බෝපැත්ත කෙළවර දක්වාම හැකි ලෙස එම මාර්ගය සකස් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බවත්, මෙවැනි කාර්යයක් සිදු කිරීමේදී කම්බියක් වදිනවා වැනි සුළු දෙයක් මුල් කර ගෙන මෙම ව්‍යාපෘතියට විරුද්ධව කතා නොකර එය යම්කිසි ක්‍රමවේදයකට සකසා ගෙන ව්‍යාපෘතිය ඉදිරියට සිදු කරගෙන යාමට සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා පැවසූ කාරණා කාටත් වටිනා පොදු කාරණාවක් බවත් සමහර ස්ථානවලට ගිය විටදී තමන්ද අපහසුතාවයට පත්වූ අවස්ථා තිබූ බවත්, පාරවල් සෑදීමට පෙර "පාර වසා ඇත "යනුවෙන් දැන්වීමක් යොදා ජනතාව දැනුවත් කිරීම සුදුසු බවත් විශේෂයෙන්ම මන්ත්‍රීතුමන්ලාහට පවසා ඇත්තේ මාර්ගයක් සැකසීමේදී මාර්ග කමිටුවක් පත් කර ගැනීමට කටයුතු කරන ලෙසත් මාර්ගයේ වතුර බසින ස්ථානය, පළල් කළ යුතු ස්ථාන ආදී කාරණා පිළිබඳව එම කමිටුවේ අය හොඳින් දන්නා බවත් මාර්ග කමිටුව සඳහා ගමේ අය පත්වීම එහිදී වැදගත් වන බවත් මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් සිදු කළ ව්‍යාපෘතියක් බැවින් සභාවේ කාර්මික නිලධාරීන් ඒ සඳහා යොමු කිරීමට නොහැකි බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පාරවල් සහ කාණු සභාවට අයත් දේවල් බැවින්, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඒ පිළිබඳව නොසලකා කටයුතු සිදු කරන බවත් එ සම්බන්ධ යෝජනාවක් සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාවේ පාරවල් අඩුම තරමින් අඩි 10 ක් වත් තිබිය යුතු බවට ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවේදී යෝජනාවක් ගෙන ආ බවත් ව්‍යාපාතිය සිදු කරන ස්ථානයට ගොස් තමන් ද නිරීක්ෂණය කළ බවත් මෙම ගැටලු ආදර්ශයට ගෙන සියලු

දෙනාම එවන් කාර්යයක් සිදු කිරීමේදී අදාළ පිරිස් දැනුවත් කිරීමක් සිදුකර අදාළ ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම සුදුසු බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

04.(i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය.

තලගහමුල ජනක ලී බඩු වෙළෙඳසැල ඉදිරිපිට මහා මාර්ගයේ සිට දුම්රිය මාර්ගය දක්වා ඇති අතුරු මාර්ගයේ සංවර්ධනය නොකළ කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

04.(ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය.

අරලිය උයන ගම්මානයේ මාර්ග සියල්ලෙහි ම ජලය ගලා බස්සන, දැනට ගිලා බැසිමට ලක්ව ඇති බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

05.(i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.

බෙරුවාන වත්ත අක්කර 50 රජයේ ඉඩමේ කොටස් අංක 45/46 මැන නිරවුල් කර පොදු කටයුතු සඳහා පවරා ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා**.**

අක්කර 50 ප්‍රදේශයට තමන් නිරීක්ෂණය කිරීමට යාමේදී මෙම ගැටළුව පිළිබඳව සභාවේ කතා කරන ලෙස තම හිතවතුන් පැවසූ බවත් එහි මැනුම් කටයුතු සභාව මැදිහත් වී නිරවුල් කරන ලෙස ඔවුන් පැවසූ බවත් එම ඉඩම් ගැටළුව නිසා මිනිසුන් අපහසුතාවයෙන් සිටින බැවින් සභාව මැදිහත් වී එම මැනුම් කටයුතු සිදු කර දෙන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

එම ස්ථානයේ නිරීක්ෂණ කටයුතු සඳහා තමන්ද සහභාගී වූ බවත් ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් එම රජයේ ඉඩම් බෙදා දුන් බවත්, ඉඩමක් බෙදීමේ දී පොදු කටයුතු සඳහා ඉඩක් වෙන් කරන බව අප කවුරුත් දන්නා කරුණක් බවත්, එම ගම්වාසීන් පවසන පරිදි එම ඉඩ වෙන්කර ඇත්තේ එම 45 සහ 46 කොටුවේ බවත්, එම ලිපිගොනු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා සමඟ තමන් ද එම ස්ථානයට ගොස් එම ගමේ මිනිසුන් සමඟ සාකච්ඡා කර, සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස ගම්වාසීන්ගේද අත්සන් සහිතව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ලිපිගොනු භාර දුන්නද එම කාර්යය සිදු නොවූ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම නිසා මෙහිදී සභා යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන බවත්, එම කාර්ය සිදු නොවීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් හේතු විමසූ විට දැන ගැනීමට හැකි වූයේ එම භාරදුන් ස්ථානයෙන් ඉඩම් අංශයට ලිපි යොමු වී නොමැති

බවත්, ඉඩම් අංශයෙන් පවසා ඇත්තේ ගමේ මිනිසුන් ලෙස ඉදිරිපත් කළහොත් ක්‍රියාමාර්ගයක් ගත නොහැකි බවත් යම් කිසි සංවිධානයක් හෝ ප්‍රාදේශිය සභාව හරහා ඉල්ලීමක් සිදු කළහොත් ඔවුන්ට මැදිහත්වීමක් සිදුකළ හැකි බව පැවසූ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එහි පවුල් 200ක් පමණ සිටින බවද 45 හා 46 කොටස ඔවුන් හඳුනාගෙන ඇති බවද ඔවුන් දක්වන ප්‍රතිචාරය අනුව එය නිවැරදි බවද එම 45සහ 46 ඉඩම් කොටස් දෙකෙහි නිරවද්‍යතාවය පිළිබඳව සලකා බලා මැනුම් කටයුතු සිදුකර නැවත අත්පත් කර ගෙන සභාවට පවරාගෙන පොදු කටයුතු සඳහා වෙන්කිරීමට ගමේ මිනිසුන් කැමැත්ත ප්‍රකාශ කර ඇති බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ අදහසට වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා පෙ.ව 10.17 ට සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
එම ලිපිගොනු සභාවවට ද භාරදෙන ලෙසත් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබාදිය හැකි බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

06.(i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා.

තොරණගොඩ ඉන්ධන පිරවුම්හල ඉදිරියෙන් වෙරළුගහහේන මාර්ගයට පිවිසෙන අජිත් රෝහන මහතාගේ නිවස අසල කැඩී ගොස් ඇති පැති බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා.

මෙම යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාව වන විටත් එම මාර්ගය කාණු පද්ධතියත් සමඟම කැඩී ගොස් ඇති බවද මෑතකදී වාහන දෙකක් මාරු වීමට යාමේදී එක් වාහනයක් එම ස්ථානයෙන් පහළට වැටී අනතුරකට ද පත්වූ බැවින් එය කඩිනමින් සකස් කරදෙන මෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

එම මාර්ගය කඳු ආශ්‍රිත මාර්ගයක් බවද වාහන මාරු වීමේදී දැනටමත් වාහන කිහිපයක්ම අනතුරකට පත්ව ඇති බවද එම මාර්ගයේ ගමන් කිරීම අනතුරුදායක තත්වයක් බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

07.(i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

ඇහැලියගොඩ පොළ භූමිය තුළ නිත්‍යානුකූල අයිතියකින් තොරව කොටු කර ඇති කොටස සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව විසින් භුක්ති විඳිනු ලබන පැරණි සතිපොළ පැවති කොටස තුළ,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව මගින් නැවතත් සිල්ලර වෙළෙඳුන් සඳහා සතිපොළක් හා රථ ගාලක් සකස් කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඒ සඳහා අවිස්සාවේල්ල දිසා අධිකරණයේ 3068/SPL නඩුකරය ප්‍රකාරව, සභාවට හිමිවන ලද ඉඩමට අදාලව අ.ග.පි.691 හි කැබලි අංක 165 මැනීමේ අනුරේඛණයේ අංක R/EHL/2007/329 දරණ සැලැස්ම තුල, ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කැන්දන්ගමුව නගරය ග්‍රාම නිලධාරී වසමෙහි කැන්දන්ගමුව නගරය ගමෙහි පිහිටා ඇති අ.ග.පි. 691හි කට්ටි අංක 89යේ කොටසක් වන J අක්ෂරයෙන් පෙන්වා ඇති ප්‍රමාණයෙන් හෙක්.0.0382ක් වන බිම් කොටසත් ඉහත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අත්පත්කර ගැනීමට යෝජනා කරමි යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් එම යෝජනාව සවිස්තරව ඉදිරිපත් කරන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

සභාවක් ලෙස අප බුක්ති විඳින්නේ මුල් කාලයේ ගම් කාරක සභා දැන් ප්‍රාදේශිය සභා ලෙස පවරා ගත් දේ හෝ සභාව විසින් මිලදී ගත් දේවල් හෝ පරිත්‍යාගශීලීන් විසින් පරිත්‍යාග කළ දේවල් බවත්, මෙවන විට සභාවේ වත්කම් සම්ක්ෂණ සිදු කරගෙන යන බවත්, වසම්වල පොදු කටයුතු සඳහා වෙන් කළ භූමි සභාව සතු ලේඛනවල සඳහන්ව ඇත්තේ සීමිත ප්‍රමාණයක් බවත්, එසේ වී ඇත්තේ සභාව සතු දේපළ විධිමත්ව සභාවට පවරා නොගැනීම බවත් ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා පෙ.ව 10.21 ට සභා ගර්භයෙන් පිට විය.

පැරණි පොළ භූමිය තිබූ ඉඩම එකල සභාවට පවරාගෙන ඇත්තේ නිවාස සංකීර්ණයක් සඳහා බවද පසුව එම ස්ථානයේ පොළ භූමියක් පවත්වාගෙන ගොස් ඇති බවද 2015 වර්ෂය වන තෙක් එම පොළ භූමිය පවත්වාගෙන ගොස් තිබූ බවද පසුව නව පොළ භූමිය ඉදිකරගෙන යාමේදී එතන පුද්ගලයෙක් එම ඉඩමට හිමිකම් කියා නඩුවක් ගොනු කළ බවත්, හිමිකම් කියූ නඩුව එතුමන්ම ඉල්ලා අස්කරගෙන ඇති බව ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තමන් දන්නා පරිදි එතුමන් හට එහි නීත්‍යානුකූල අයිතියක් නොමැති බවත් එලෙස අයිතියක් එතුමන් නොපෙන්වන බවත් එමනිසා සභාව විසින් භුක්ති විඳි දේපළක් වසර ගණනාවක් තුළ අහිමි කරවා ඇති බවත්, අජන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත් මන්ත්‍රීවරු හැටියට තම තමන්ගේ නමවලට කැළලක් ඇති නොවන ආකාරයෙන් කටයුතු කළ යුතු බවත් ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

රේල් පාරේ තිබූ සභා මුදලින් ඉදිකල වැසිකිළි පද්ධතියක අයිතිය සම්බන්ධයෙන් ද ඇතැම් මන්ත්‍රීතුමන්ලා අදහස් දක්වන බවත් එම නිසා සභාවේ මන්ත්‍රීතුමන්ලා ලෙස සභාවට අයත් දේපල සුරක්ෂා කිරීමට අයිතියක් ඇති බවත් එම අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කල යුතු බවත් ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා ගෙන ආ යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් බවත් දේශපාලන හෝ පෞද්ගලික ලෙස සමහරු එය නොයෙක් ලෙස අර්ථකථනය කලත් එය සභාව භුක්ති විඳි දේපලක් බවත් තම පියා වෙළඳාම් කටයුතු සිදු කළේද එම ඉඩමේ එක් කොටසක බවත් එබැවින් එය වසර ගණනාවක් තුළ භුක්ති විඳි දේපළක් බවත් සභාවක් ලෙස සභාව සතු වත්කම් දේපල ආරක්ෂා කිරීම වගකීමක් බවත් අනාගත ගැටළු ඇති නොවන ලෙස එය ක්‍රියාත්මක කරන ලෙසත් ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමාගේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත් සභාවට නඩු තීන්දුවකින් අයත් වී ඇති කොටස පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන කොටු කරන තෙක් බලා සිටීම තමන්ට ගැටළුවක් බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.
ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එම කොටස සභාවට නීත්‍යානුකූලව අයිති වී නොමැති බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමාගේ කතාවෙන් තමන්ගට පැහැදිලි වූයේ එය සභාව විසින් භුක්ති විඳි කොටසක් බවත් එය වෙනත් අයෙක් විසින් කොටුකරගෙන සිටිනවාය යන අදහස බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එම නඩු තීන්දුව නැවතත් ඇසෙන පරිදි ප්‍රකාශ කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා ඉල්ලා සිටින ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

ඒ අනුව එම නඩු තීන්දුව නැවතත් ප්‍රකාශ කරමින් එතුමන් සඳහන් කරන ලද්දේ,මෙහිදී තමන් ඉදිරිපත් කරනු ලබන්නේ පර්චස් 11.6ක් සභාවට අයත් කොටසක් නොවන බවත් එය වෙනත් අයෙකුටද ලබාදී නොමැති බවත් එම ඉඩම මෙතෙක් කලක් භුක්ති විඳි සභාවට මෙම කොටස අයත් විය යුතු බවත් කිසිදු අයෙකුට ඔප්පුවක්ද නොමැති නම් එය සභාවට අයත් බවත් වෙනත් අයෙකුට එය කොටුකර ගැනීමට අයිතියක් නොමැති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

අධිකරණයේ නඩු තීන්දුව ලබා දෙන දින ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා ඒ සඳහා සහභාගී වූ බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා.

3068/SPL නඩුකරයේ පෙත්සම්කාර පාර්ශවය විසින් එම නඩුව ගොනුකර තිබුණේ 165 සහ 691 යන කොටස් සඳහා බවත් 165 කොටස සභාව භුක්ති විඳින කොටස බවද එය පෙත්සම්කාර පාර්ශවය විසින් ඉල්ලා අස්කර ගත් බැවින් සභාව භුක්ති විඳි 165 කොටස සභාවට අයත් වූ බවත් එතුමන් සඳහන් කරන ලදී. එය කොටස් දෙකකට ඇති බවත් 165හි කට්ටි අංක 89 කොටස තිබෙන්නේ ඉදිරිපස පාරත් සමඟ බවද එය වෙනම කොටසක් බවත් මෙම නඩුවට අදාළ නොවන බැවින් එය වෙනම අත්පත් කරගත යුතු බවද අප විසින් අත්පත් කර ගෙන තිබෙන 165 කොටස පොළ භූමිය සමඟ ගොඩනැගිල්ල තිබෙන ඉඩම එම කොටස සභාව සතු ඉඩමක් බැවින් සභාව සතු වී ඇති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ගැටළුව වී ඇත්තේ මේ සම්බන්ධව ලිපි ලේඛන සොයා ගැනීම අසීරු කටයුත්තක් වී ඇති බවත් බොහෝ ලේඛන අස්ථානගත වී ඇති බවත් ලිපි ලේඛන නිසියාකාරව ඇත්නම් බොහෝ ගැටළු විසඳාගත හැකි බවත්,මේවන විට මැනුම් කටයුතු සිදුකර ඇති බැවින් ඉතිරි කොටස සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ හැකි බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. සමන්සිරි විජේසිංහ මැතිතුමා.

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ජනපද නිලධාරී මහතා සමඟ සාකච්ඡා කළ බවත් එතුමා ප්‍රකාශ කළේ පරණ පොළ භූමියේ සියලුම කොටස් වලින් 165 හි කට්ටි අංක 89 හි පර්චස් 11ක පමණ ප්‍රමාණයක් අපට අයිතිය නොලැබුණු බවත් අනෙක් කොටසට පමණක් අයිතිය ලැබුණු බවත්ය.එසේ අයත් නොවීමට හේතුව අනෙක් කොටසට අයිතිකාරයන්ට රජයේ තක්සේරුව අනුව මුදල් ගෙවා රැගෙන තිබීමත් නිසා බවත්ය. එම ජනපද නිලධාරීතුමා පවසනු ලබන්නේ එම 165 හි අත්පත් කරගත් කොටසට නීත්‍යානුකූලව රජයේ තක්සේරුව අනුව වන්දි ගෙවා අයත් කරගෙන ඇති බවත්ය.එමෙන්ම කොටස් දෙකම මේවන විට සභාව භුක්ති විඳ ඇති බවත්ය. එම නිසා පර්චස් 11 ක කොටසේ සභාවට නීත්‍යානුකූල අයිතියක් නොමැති වුවත් භුක්තියේ අයිතිය ඉල්ලා සිටිය හැකි බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. සමන්සිරි විජේසිංහ මැතිතුමා ප්‍රකාශ කරන ලදී.තමන් දන්නා පරිදි එම වැටවල් ගසා තිබෙන කිසිම කෙනෙකුට අයිතියක් නැති බවත් සභා යෝජනාවක් මගින් සම්මත කරගෙන එම පර්චස් 11ක ප්‍රමාණය සභාවට අයිති කර ගත හැකි බවත්, කවුරුන් හෝ ඉදිරිපත් වුවහොත් නඩුවක් ගොනු කරනු ඇතැයි එම ජනපද නිලධාරීතුමා පැවසූ බවත් එතුමන්

සඳහන් කරන ලදී.එලෙස නඩුවක් පැවතියහොත් සභාවට ඉඩම් කොටසක් ලබාදුන් පරණ අයිතිකාරයන් වෙත වන්දියක් ගෙවා එම ඉඩම් කොටස ලබා ගත්තද මෙම ඉඩම් කොටස සඳහා කිසිවෙක් ඉදිරිපත් නොවුනහොත් වන්දි නොගෙවා අයත් කරගත හැකි බවත්, එලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් විය යුතු දෙය ජනපද නිලධාරීතුමා සිදු කරදෙන බව පැවසූ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. සමන්සිරි විජේසිංහ මැතිතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. සමන්සිරි විජේසිංහ මැතිතුමා ප්‍රකාශ කළ කාරනාව මේ මොහොතේ සිදු වෙමින් පවතින බවත්, මේ සම්බන්ධව ඉදිරියට කරුණු සාකච්ඡා කිරීමට පෙර විෂය නිලධාරී කැඳවා කරුනු දැන ගෙන සාකච්ඡාව ඉදිරියට පවත්වාගෙන යැම සුදුසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මහා සභාව කාරක සභාවක් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව මම ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 10.33 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 10.35 ට නැවත සභාවට පැමිණෙන ලදී.

07.(i) යෝජනාවට අදාළව කරුණු මේ අවස්ථාවේ සාකච්ඡා කරන්නට විය.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

මහජන ඡන්දයෙන් තේරී පත්වූ මහජන නියෝජිතයින් ලෙස ද මෙහි දීර්ඝ කාලීනව නොසිටින බවද උපරිම අවුරුදු හතරක් සිටින බවද තව වසරක් දීර්ඝ කරනු ලබන්නේ ගරු ඇමතිතුමා කැමති වුවහොත් බවද පසුව තව අවුරුද්දක් ලබාදීමට මිනිසුන් කැමති විය යුතු බවද ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා පෙ.ව 10.50 ට සභා ගර්භයෙන් පිට විය.

මෙහි සිටි මහජන නියෝජිතයින් සභාවේ දේපළ සම්බන්ධයෙන් වත්කම් තහවුරු නොකර, අයිතිය තහවුරු කිරීමක් සිදු නොකර කවුරුන් හෝ කට වචනයට කියූ පමණින් අයථා ලෙස ලබාදී ඇති බවද ඉදිරියේදී ඒවා සෙවිය යුතු බවද සභාවේ දේපල යනු මහජන දේපල බවද අප එය ආරක්ෂා කිරීම කුහක කමක් ,ඊර්ෂ්‍යාවක් නොවන බවද එම අදාළ පාර්ශවයන්ට පණිවිඩ ගෙනියන අයට මෙය පවසන ලෙසත් අප පැමිණ තිබෙන්නේ මහජන දේපල ආරක්ෂා කිරීමට බවද එය ජනතාව ලබාදුන් වරමක් බවද ඉදිරියට කටයුතු සිදු කරන්නේ ජනවරමට අනුව බවද එම නිසා මේ කටයුතු ඉදිරියට සිදු කිරීමට එය බාධාවක් නොවන බවද ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

නීත්‍යානුකූල අයිතියකින් තොරව තිබෙන දේපලක් ලෙස මෙම යෝජනාවේ සඳහන් වන බවත්, ගරු උප සභාපතිතුමාගේ කතාවෙන් තේරුම් ගත හැක්කේ සභාව සතු දේපල නගරයේ සහ යම් ප්‍රදේශවල අයිතිවාසිකම් කියමින් සිටින බවද මේ සියලු දේවල් පිළිබඳව දැනටද ක්‍රියාමාර්ගයක් නොගන්නේ ඇයිද යන්න පිළිබඳ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා ගරු සභාපතිතුමාගෙන් විමසා සිටින ලදී.

කාරක සභා අවස්ථාවේ ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් වැසිකිලි පද්ධතියක් සම්බන්ධව ප්‍රකාශ කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් කඩවල් කිහිපයක් සම්බන්ධව ප්‍රකාශ කළ බවත්, ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග නොගන්නේ ඇයි දැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.වින්තක කරුණාරත්න මැතිතුමා ගරු සභාපතිතුමාගෙන් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ගරු සභාපතිතුමා බොහොම මධ්‍යස්ථව මෙම සියලු කටයුතු පාලනය කරමින් ඇහැලියගොඩ නගරය කේන්ද්‍රකර ගනිමින් ලොකු වැඩපිළිවෙලක් ගෙන යන බව අප සියලුදෙනාම දන්නා බවත්, නමුත් සමහර ක්‍රියාකලාපයන් තුළ ගරු සභාපතිතුමාගේ සද්භාවය කියනා දෙය නැතිවී යන බවද මෙය තම අදහස බවද එය වැරදි නම් ගරු සභාපතිතුමාට වැරදි බව කිව හැකි බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

1987 අංක 15 දරන පනතෙහි සෑම දෙනාගේම සීමාවන් සටහන් කර ඇති බවද ඉතිහාසය දෙස බැලීමේදීද 1991 පළාත් පාලන පනතේ මුලින්ම ප්‍රාදේශිය ලේකම් ,මුලින් ම ලේකම් තනතුරට පත් වූ බවත් ප්‍රාදේශිය ලේකම්ට මහ සභාවේදී වචනයක්වත් කතා කළ නොහැකි බවත් නිහඬව සිටිය යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අප අලුතින් පැමිණි විට අත්දැකීම් අඩු බවත් තව අයෙක්ගෙන් අසා දැනගත යුතු බවත් අපද එසේ බවත් ගරු සභාපතිතුමන් මෙම බල ප්‍රදේශයේ ලක්ෂයක් ජනතාවගේ පලමු පුරවැසියා බවද සභාපතිතුමාගේ එම භූමිකාව,ගෞරවය , අභිමානය පාවා නොදෙන ලෙසද මෙය බොහොම වගකීමෙන් පවසන බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

1987 අංක 15 දරන පනත ගරු සභාපතිතුමාගේ ආණ්ඩුවෙන් ප්‍රජාතන්ත්‍රවාදීව වෙනස් කිරීමක් සිදු කිරීම ගැළුවක් නොවන බවද සීමාවන් පැනීමට ඉඩ නොතබන ලෙසද එය සභාවට සිදු කරන අගෞරවයක් බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 10.53 ට සභා ගර්භයෙන් පිට විය.

08.(i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

විලේගොඩ වඩුවන්ගොඩ ලාල් මහතාගේ නිවසට යන මාර්ගයේ කැඩී අබලන් තත්ත්වයේ පවතින දැල් පාලම ඉවත් කර නැවත පාලම සකස් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා පෙ.ව 10.56 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

ගියවර සභා වාරයේ මන්ත්‍රී පැහැදිලි කිරීම් අවස්ථාවේ මේ සම්බන්ධයෙන් කතා කළ බවත් එම දැල් පාලම මේවනවිට දිරාපත්ව ඇති බවත්, එම ප්‍රදේශයේ නිවාස 25 ක් පමණ පවතින බවත්, වාහන ගමන් කිරීමේදී එම ස්ථානය ගිලා බැසිය හැකි බැවින් එය සකස් කර දෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ඉල්ලා සිටින ලදී.

දීගල්ල ගමට තමන් විදුලි පහන් ඉල්ලා සිටින්නේ කිසිදු ස්ථානයකින් විදුලි පහන් කණුවක් නොලැබී ඇති බැවින් බවත් යෝජනාවක් ලෙස ඉදිරිපත් කළේ විදුලි පහන් කණු 03ක් සවිකර දෙන ලෙස බවත්, 2025 ජුලි මස සභා රැස්වීම සඳහා ද මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, යෝජනාව ඉවත් කර ඇති නිසා මේ අවස්ථාවේ ද නැවතත් විදුලි පහන් කණු

03ක් සවිකර දෙන ලෙස මෙම ඉල්ලීම කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එම ගැටළුව පිළිබඳව ලිපියක් මගින් යොමුකර ඇති බවත්, එම ලිපිය මගින් එම ලිපිය මඟින් "අංක 3 යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව, සභා සම්මුතියක් මඟින් සිදු කළ යුතු යෝජනාවක් නොවන බැවින්, දීගල්ල ග්‍රාමයේ විදුලි පහන් සවි කළ යුතු ස්ථාන සම්බන්ධ නාම ලේඛනයක් සමඟින් ලිඛිත ඉල්ලීමක් මා වෙත ලබා දෙන මෙන් දන්වමි." යනුවෙන් ප්‍රතික්ෂේප වීමට හේතුව සඳහන් කරමින් ලිපි යොමු කර ඇති බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

එසේ ප්‍රතික්ෂේප වීමට හේතුව සඳහන්කර ලිපියක් තමන්ට නොලැබුණු බවත් ලිපිනය වෙනස් වී ඇති බවත් එතුමිය ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ලිපිනය වැරදි නම් ලිඛිතව ලබාදෙන ලෙසත්, එම විදුලි පහන් ලබාදීමට අකමැත්තක් නොමැති බවත් නිශ්චිතව ස්ථානය සඳහන් කර නොතිබුණ බවත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

සභාව විසින් යොමු කරන ලිපි සියල්ල තමාගේ මහ ගෙදරට යන බවත්, මින් පෙරද ඒ බව සභාව දැනුවත් කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මන්ත්‍රීතුමිය විසින් සබාවට ලබා දී ඇති ලිපිනයට ලිපි තැපැල් කර ඇති බවත්, ලිපිනය වෙනස් වීමට අවශ්‍ය නම් එය ලිඛිතව ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා.

ගරු සභාපතිතුමන් මේ සඳහා උදව් කරන බව අප තේරුම් ගත යුතු බවත් අප කරන රාජකාරිය නිසියාකාරව සිදු කළ යුතු බවත් විදුලි බල්බ සවි කිරීමට අවශ්‍ය ස්ථාන ලිඛිතව ගරු සභාපතිතුමන් වෙත ලබාදෙන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා ද ඉල්ලා සිටින ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

විලේගොඩ දැල් පාලම තොරණගොඩ මෙන් විශාල බැස්මක් ඇති බවද එය වඩුගන්ගොඩ මාර්ගයට සම්බන්ධ වන අතුරු මාර්ගයක් බවත් මේ සඳහා ඉක්මන් විසඳුමක් නොලැබුනහොත් විශාල අනතුරක් සිදුවිය හැකි බවද දැල් කොටස නැවත අලුත්වැඩියා කිරීම සඳහා පමණක් වියදමක් සිදුවන බවත් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලෙසට තමන්ගෙන්ද ඉල්ලීමක් සිදුකළ බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

තමන් විසින්ද මෙම සභාවට සංවර්ධන යෝජනා බොහොමයක් ඉදිරිපත් කළ බවද මෙම සංවර්ධන යෝජනා ඉදිරිපත් කරනු ලබන්නේ 2026 අයවැය ප්‍රතිපාදන මගින් සිදු කිරීමටද යන්න පිළිබඳව එතුමන් ගරු සභාපතිතුමාගෙන් විමසා සිටින ලදී.
ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

තව සුළු මුදලක් පමණක් ඇති බැවින් විශාල ප්‍රමාණයේ යෝජනා ඉදිරිපත් නොකර මෙවැනි සිදුකළ හැකි යෝජනා ඉදිරපත් කරන ලෙසත් මීටර් 100 ,200 කොන්ක්‍රීට් කිරීමට මුදල් නොමැති බවද මුදල් තිබුණද අයවැය ප්‍රතිපාදන මත සිදු කළ නොහැකි බවද ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා**.**

කොපමණ මුදල් වටිනාකමක සංවර්ධන යෝජනා ඉදිරිපත් කළ යුතුද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා ගරු සභාපතිතුමාගෙන් විමසා සිටින ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා පෙ.ව 11.01 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

නිශ්චිතවම කිව නොහැකි බවත් රුපියල් ලක්ෂ 02,03ක ප්‍රමාණයක යෝජනා ඉදිරිපත් කල හැකි බවත්, බැකෝ යන්ත්‍රය මේ වන විට සාදා ඇති බැවින් එම යන්ත්‍රය යොදා ගෙන සිදු කරන කාර්යන් සඳහා වැඩි වියදමක් නොයන බැවින් එවන් කාර්යයන්ද සිදු කළ හැකි බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.02 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා ජේෂ්ඨ පුරවැසියෙක් ලෙස මෙම කාලය තුළ එතුමාට යමක් සිදුකිරීමට වුවමනාවක් ඇති බවත්, ඒකාබද්ධකාරක සභාවේදී විපක්ෂ කණ්ඩායමට මුදලක් වෙන් කර දෙන බව ප්‍රකාශ කළ බවත්, ඒ පිළිබඳ මේ මන්ත්‍රීතුමන්ලා ප්‍රශ්න කරන බවත්, එතුමාට පොඩි හරි මුදලක් ඉල්ලා සිටි බැවින් එතුමා සතුටු විය හැකි ලෙස එතුමාගේ අවසාන කාලයේ මෙම ප්‍රාදේශිය සභාවට පැමිණ සිදු කළ එම ඉල්ලීම ඉටුකර දෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී. මෙහි සිටින ජ්‍යෙෂ්ඨතම පුරවැසියා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා බවද එතුමා ඒකාබද්ධ විපක්ෂයේ රැස්වීම් වලදී එතුමාගෙන් විශාල ඔවදන් ලැබෙන බවද , එතුමා විශ්‍රාමික රාජ්‍ය නිලධාරියෙක් බවද එතුමා ලබපු අත්දැම් ද ඇති බවද විපක්ෂයේ කණ්ඩායමේ විශාල ගෞරවයක් එතුමාට හිමි වන බවත් තමාට රුපියලක්වත් අවශ්‍ය නොවන බවත් තම කොටසත් සමඟම ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාට ලබාදෙන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එතුමාට ගරු කිරීමක් ලෙස මීට පෙර ආයුර්වේද සායනයක්ද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ වසමේ පැවැත්වූ බවත් එතුමාගේ යෝජනාවක් අනුව මසකට වරක් ආයුර්වේද සායනයක් පැවැත්වීමට කටයුතු කරන බවද ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

08.(ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

බෝපැත්ත ඇගලුම් කම්හල පිටුපස පොදු නාන ළිඳ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.05 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා පෙ.ව 11.005 ට සභා ගර්භයෙන් පිට විය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ස්ථිර කරන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

මෙම නාන ළිඳ වසර 10 කාලයක සිට සාදා ඇති නාන ළිඳක් බවත් මෙහි ගැටලුකාරී තත්ත්වයක් ඇති බවත්, මහින්දරාජා යන අයගේ නිවසට පාරක් නිසි ලෙස නොමැති බව පවසමින් සභාවෙන් සිදුකරන ලද ඉල්ලීම අනුව එම ස්ථානය පරීක්ෂා කල බවද, ඒ සඳහා ඒ සඳහා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමාද සහභාගී වූ බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

එම පුද්ගලයාට මෙන්ම පොදු නාන ළිඳ වසන මට්ටමට ගැටළු පැමිණ තිබෙන බවද සභාවට ලද තොරතුරු අනුව මෙය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ,නව නගරය,රත්නපුරට මෙය යවා ඇති බවද ඒ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අපවෙත එවා තිබෙන්නේ “උක්ත ගැටළුව නිරාකරණය කිරීම සඳහා ඔබ ආයතනයට අයත් මෙම ඉඩම් හා ඉඩම් වලට අදාල සැලැස්මක් මේ දක්වා මෙම ආයතනයට ලබාදී නොමැති බැවින් එම ඉඩම් වලට පිවිසෙන මාර්ගය හා කාණු පද්ධතිය දැක්වෙන සිතියමක් ලබාදෙන ලෙසත් මෙම ඉඩම් වල මායිම් ලකුණු කර මාර්ගය සකස් කර ජලය බැසයන ආකාරයට වැඩපිළිවෙලක් සකස්කර දෙන ලෙසත් එම මැනුම් කටයුතු සිදුකිරීමට ප්‍රාදේශිය සභාව දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වමි” යනුවෙන් ලිපියක් යවා ඇති බවද පසුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අපවෙත එවා තිබෙන්නේ නිවසට ගලා යන ජලය පිළිබඳ ගැටළුව පිළිබඳ මාතෘකාව රැගෙන ඇති බවත් ගෙදරට යන පාර සම්බන්ධව කියා එහි සඳහන් නොවන බවත් මෙහි අවසානයේදී සඳහන් වන්නේ,ඒ අනුව මැනුම් කටයුතු සිදු කිරීමේදී වන ගැටළු නිරාකරණය කර ගැනීමට හැකි බව සඳහන් වන බවත් එතුමිය සඳහන් කරන ලදී. එහි තිබෙන්නේ ඉහත ඉඩමේ අනවසරයෙන් පදිංචි වී බුක්ති විඳිනු ලබන අනවසර පදිංචිකරුවන් 18 දෙනෙක් සිටින බවත් ඔවුන්ගේ ඉල්ලීමක් අනුව මෙම මාර්ග සිතියම්ගත කිරීම සිදුවන බව සඳහන් කර ඇති බව එතුමිය සඳහන් කරන ලදී.

මෙහි සභාපතිතුමාට වැරැද්දක් වන සිද්ධියක් තිබෙන බවත් මෙම ඉඩම මහින්දරාජා කියන පුද්ගලයාට මේවන විට බලපත්‍ර ලබාදී තිබෙන ඉඩමක් බවත් එය අනවසර ඉඩමක් නොවන බවත්, සභාපතිතුමා විසින් මහින්දරාජා කින පුද්ගලයා දැනුවත් කර ඇති බවත්, එම ලිපියට අනුව පිරිස එකතුකර මැනුම් කටයුතු සිදු කර මෙම ගැටළුව නිරාකරණය කරයි කියා බලා පොරොත්තුවෙන් බවත්, නමුත් මෙහි අවසානයට ඇත්තේ ජනාධිපති ලේකම් ,ජනාධිපති ලේකම් කාර්යාලය ගාලුමුවදුර, කොළඹ 07.ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,රත්නපුරට යවා තිබෙනවා “මෙහි කිසිම ගැටළුකාරී තත්වයක් නෙමෙයි තිබෙන්නේ මෙම ගැටළුකාරී තත්වය විසඳීමට නම් ගුණසීල මහත්මා විසින් එනම් මහින්දරාජා මහත්මාගේ නිවසට යන පාර අවහිර කර තිබෙන ස්ථානයේ ගුණසීල මහත්මා විසින් භුක්ති විඳින අඩි 12ක පමණ බිම් තීරුවෙන් අඩි 03ක් හෝ 4 ක හෝ බිම් තීරුවක් වෙන්කර කාණුව සකස් කිරීමේ.....”

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෙම කාරණය මෙයට අදාල නොවන බැවින් කාරක සභා අවස්ථාවේදී හෝ වෙනත් කතා වාරයේදී පවසන ලෙස ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

ඒ අතර ගැටලුව තිබෙන්නේ ගුණසීල මහතා කියන පුද්ගලයා ඉල්ලා තිබෙනවා බදු පදනම මත මෙය බුක්ති විඳීමට.ඒ නිසා පොදු නාන ළිඳට යන එක නතර වෙලා තිබෙන බවත්, මෙය විසදා දෙ බව දන්වා සභාපතිතුමා විසින් මහින්දරාජා දැනුවත් කර තිබෙන බවත් මෙම ගැටළුව සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දැනුවත් කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.06 ට සභා ගර්භයෙන් පිට විය
ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා පෙ.ව 11.06 ට. නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා පෙ.ව 11.08 ට සභා ගර්භයෙන් පිට විය
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.08 ට නැවත සභාවට පැමිණෙන ලදී.

09. (i) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

පහත සඳහන් මාසවල දෛනික සේවකයින්ගේ හා නිලධාරීන්ගේ වැටුප් ලෙස ගෙවා ඇති ගෙවීම් වවුචර් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

ස්ථිර සේවක - ජූලි මාසය - රුපියල් 5,674,963.72
දෛනික සේවක - ජූනි මාසය - රුපියල් 1,348,162.74

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා පෙ.ව 11.09 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 11.09 ට සභා ගර්භයෙන් පිට විය.

09. (ii) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කැන්දන්ගමුව නගරය ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත්, ඇහැලියගොඩ මහජන පොළ භූමියේ පිහිටි මාර ගස අනතුරුදායක ගසක් බව දන්වා ඇති බැවින්, එය කඩිනමින් ඉවත් කරන ලෙස දන්වමින් ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම්ගේ EHEDS/ADM/04/TIMB/05/2026 අංක හා 2026.06.12 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත.ඒ අනුව මාර ගස තක්සේරු කිරීම කාර්යාල නිලධාරීන් සිදු කර ඇති අතර, ඔවුන් විසින් මාර ගස වෙන්දේසි කිරීමේ දළ තක්සේරු මුදල රුපියල් 250,000.00 ක් ලෙස දන්වා ඇත.එම මුදල අවම ලංසු මුදල සේ සලකා මාර ගස වෙන්දේසි කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

10. (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා.

රං ගෙදරවත්ත සිට කොඩිප්පිලිවත්ත දක්වා මාර්ගයේ අතරමැද කොටස බැකෝ යන්ත්‍රයක් මඟින් කපා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 11.11 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා.
මෙම මාර්ගයේ දෙපැත්තෙන්ම සංවර්ධනය කර තිබෙන බවත් මීටර් 30 ක පමණ මැද කොටසක් ඉතිරි වී තිබෙන බවත් එම මාර්ගය අඩි පාරක් ලෙස පවතින බැවින් බැකෝ යන්ත්‍රයක් මගින් කපා එම අඩිපාර සංවර්ධනය කර දෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

11. (i) ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ආදාගල සිට අරබ්බඩ දක්වා දිවෙන මාර්ගයේ ආදාගල පාසල දක්වා යන මාර්ගයේ කාණුව හරහා යොදා ඇති යකඩ රාමුව අබලන් තත්ත්වයේ පවතින බැවින් එය අලුත්වැඩියා කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය පෙ.ව 11.12 ට සභා ගර්භයෙන් පිට විය.

12. (i) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

යායපාර සමුපකාරය ළඟින් යන මාර්ගය භාවිතයට අපහසු බැවින්, මාර්ගයේ අල්ලා තිබූ කොන්ක්‍රීට් කුට්ටි ගල් ඉවත් කර නැවත මාර්ගය සහා අරමුදලින් සංවර්ධනය කරන ලදී.

මෙම මාර්ගය සංවර්ධන කිරීමේ දී ඉවත් කරන ලද කුට්ටි ගල් අතරින්, කුට්ටිගල් 1000 ක් පමණ නැවත භාවිතයට ගැනීමේ හැකියාවක් පවතී.

සංවර්ධනය කරන ලද මාර්ගයට යාබද මාර්ගයක් ද සංවර්ධනය කිරීමට ඇති බැවින් ඉවත් කරන ලද කොන්ක්‍රීට් කුට්ටි ගල් භාවිත කර, යාය පාර සමුපකාරය ළඟින් ගල් අල්ලා ඇති පාරේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමත් ඊට අදාළ රුපියල් 107,000.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කර ගැනීමටත්, අනුමත සමිතියකින් එම කර්මාන්තය ඉටු කිරීමටත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

එම ගල් හොරුන් රැගෙන ගොස් ටිකක් අඩු වී ඇති බවත් එම නිසා හැකි ඉක්මනින් මෙම කාර්ය සිදු කර දෙන ලෙසට ඉල්ලීමක් කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ගරු සභාපතිතුමාට ගරු කරනු ලබන්නේ සෑම වසමක් පිළිබඳව ම සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන බැවින් බවත් එය අතිශෝක්ත වර්ණනාවක් නොවන බවත් යකුදාගොඩ හා බුළුගහපිටිය යනු තම හදවතේ තිබෙන වසමක් බවත් වර්තමාන ආණ්ඩුවේ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමාත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා හා තමා ද එහි සිටින බැවින් එම කටයුතු ඉතා ඉක්මනින් සිදුකර ප්‍රදේශයේ ජනතාවට එය භාවිතා කිරීමට කටයුතු සලසා දෙන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

13. (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය.

මීටිපොල පොකුණ කඩය අසල නාන ළිඳ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය.

එම ළිඳ දැනට වසර 50ක් පමණ පැරණි අවට සියලුදෙනා පරිහරණය කළ ළිඳක් බවත් මේවන විට ප්‍රධාන මාර්ගයේ වතුර එම ළිඳට සම්බන්ධ වන බැවින් එය පරිහරණය කළ නොහැකි තත්වය පත්ව ඇති බවත් එම ප්‍රධාන මාර්ගයේ ජලය ළිඳට පැමිණීම වැළැක්වීමට බැම්මක් සකස් කිරීමට තමන් යෝජනා කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය.

පොකුණ කඩය අසල නාන ළිඳ බොහෝ දෙනා පරිහරණය කළ පායන කාලයේදී ද ජලය නොසිදෙන ළිඳක් බැවින් සංවර්ධනය කළ යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය පෙ.ව 11.15 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ළිඳට ඉහළින් වැසිකිළි පද්ධතියක්ද පවතින බවත්, වෙල්යාය ළිඳ ට ඉහළින්ද තිබෙන බැවින් එම ළිඳ පරිභෝජනය සඳහා සුදුසු තත්වයට පත්කර දෙන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

14. (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

බටහිර කලටුවාව කොට්ඨාශයේ හේවායින්න වසමේ බොලොක් කැලේ මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා කැපීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

එම මාර්ගය කි.මී.4ක් තිබෙන කෙටි මාර්ගයක් බවත්, එහි ගෙවල් 42 ක් පමණ තිබෙන බවත් එම කිලෝ මීටර් 4ක මාර්ගය වෙනුවට පුවක්පිටියේ සිට නාගහවත්ත පාර නමින් කෙටි මාර්ගයක් ඇති බවත් එම කිලෝ මීටර් 4ක ප්‍රමාණය මගහැර මිනිසුන්ට ගමන් කළ හැකි බවත් එහි කොටසක් සකස් කර ඇති බැවින් බැකෝ යන්ත්‍රයක් යොදාගෙන එම අතරමැද කොටස සකස් කළ හැකි බවත් විශාල වියදමක් නොයන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා පෙ.ව 11.17 ට සභා ගර්භයෙන් පිට විය.

14. (ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

හේවායින්න වසමේ කැනි ඇලුව පොල්කොටුව ගම්සභා පාර කළුඅදුර දක්වා මැන මායිම් කර බැකෝ යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

මෙම මාර්ගය පොල්කොටුව ගම්මානයට තිබෙන ගම්සභා පාරක් බවත් එම මාර්ගය මැනීම් කටයුතු සිදුකර වෙන් කර ගත යුතු බවත් මෙම ගම්මානයට විකල්ප මාර්ග දෙකක් ඇති බවත් එක් මාර්ගයක කිලෝ මීටර් 4 ½ක් පැමිණිය යුතු බවත්, එහිද වාහන ගමන් කළ නොහැකි බවත් එම ගම්මානයේ මිනිසුන් බඩු බාහිරාදිය රැගෙන යනු ලබන්නේ පා ගමනින් බවත් කොන්ක්‍රීට් යොදා ඇති එක් මාර්ගයක කන්දක් සහිත බැවින් වාහන ගමන් කිරීම අපහසු බවත් පළමු අදියර ලෙස බැකෝ යන්ත්‍ර යොදා පාර කපා මැනුම් කටයුතු සිදුකර අදියර දෙකකින් සිදුකිරීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

15. (i) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ අංක PF-7135 දරන කැබ් රථයේ රියදුරු නිවාඩු ලබා ගන්නා අවස්ථාවලදී කැබ් රථය ධාවනය කිරීමට බාධාකාරී තත්ත්වයක් ඇතිවේ. එබැවින් එම රියදුරු නිවාඩු ලබා ගන්නා අවස්ථාවලදී පමණක් අංක

PF-7135 දරන කැබ් රථය ධාවනය කිරීමට රියදුරු ලෙස කටයුතු කිරීම සඳහා A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් හිමි කොන්ත්‍රාත් පදනම මත සේවා ගිවිසුම් පදනමින් දැනට සේවයේ නියුතු කේ.ඒ.ඩී.වසන්ත කුමාර යන අයට බලය පැවරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

ඒ ශ්‍රේණිය දැන් නොමැති බවත්, එය වෙනස් වී ඇති බවත්, ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා පෙ.ව 11.19 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

එම කේ.ඒ.ඩී.වසන්ත කුමාර යන අයට අවශ්‍ය බලය ලබාදුන් පසුව එතුමාට අවශ්‍ය රැකවරණය හිමි වෙනවාද යන්න පිළිබඳව දැන ගැනීමට අවශ්‍ය බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමාන් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.
සභා තීරණයක් ගනු ලැබුවේ හම නිසා බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

සභා තීරණය ප්‍රමාණවත්ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමන් ගරු සභාපතිතුමාගෙන් විමසා සිටින ලදී. ඔහු ස්ථිර සේවකයෙක් නොවන බවත් සභා තීරණයක් මගින් ලබාගැනීම තුලින් ඔහුගේ නෛතික සුරක්ෂිතතාවය හිමිවෙනවා නම් ගැටළුවක් නොමැති බවත් එම යෝජනාවට කිසිදු විරුද්ධත්වයක් නොමැති බවත් තමන් යෝජනා කරනු ලබන්නේ එම කේ.ඒ.ඩී.වසන්ත කුමාර යන අයගේ ව්‍යත්තීය ආරක්ෂාව පිළබඳව බවත් එය සැපයෙනවානම් ගැටළුවක් නොමැති බවත් එම ආරක්ෂාව සැලසිය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

මේ සම්බන්ධව සොයා බැලු බවත්, සභා පනත අනුව යෝජනාව සම්මත කර බලය පැවරුව හොත් එය ප්‍රමාණවත් බව ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

15. (ii) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අයත් විලේගොඩ ආදාහනාගාරය සඳහා Cctv සවි කිරීම, ගිනි නිවීමේ උපකරණ සවි කිරීම හා ආරක්ෂිත උපකරණ/ හිස් වැසුම් ලබා ගැනීමට 2026.07.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී තීරණය කරන ලදී.ඒ අනුව එම අත්‍යවශ්‍ය උපකරණ සවි කිරීම හා ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.22 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.වින්තක කරුණාරත්න මැතිතුමා.

මුදල් කමිටුවේදී බෙරුවාන කසළ අංගනයේ බිල්පත් සම්බන්ධව ගැටළුවක් ඇති වූ බවත් එහිදී බිල්පත් දෙකක් ඉදිරිපත් වූ බවත් එක් බිල්පතක් රු.129000.00ක් බවත් අනෙක් බිල්පත රු.39000.00ක් බවත් ඒ සම්බන්ධයෙන් කුමක් සිදුවීද යන්න පිළිබඳව දැනගැනීමට කැමති බවත් එම බිල්පත් සඳහා ගෙවීම් සිදු නොකිරීමට ලේකම්තුමා කටයුතු කළ බවත් ඒ වෙනුවෙන් ඔවුන් නිවැරදි බිල්පත් සාදා එවා ඇත්ද යන්න පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.වින්තක කරුණාරත්න මැතිතුමා විමසා සිටින ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

මිල කැඳවීමේදී ඔවුන් ඉදිරිපත්කර තිබුණේ රු. 139000.00ක් බවත් එය ලැබී තිබුණේ කැමරා දෙකකට සහ හාඩ් ඩිස්ක් එකක් සඳහා පමණක් බවත් එම ස්ථානවයට ගිය පසු කැමරා තුනක අවශ්‍යතාවය පැන නැගුණ බවත්, කැමරා තුනක් සවි කළ පසු එහි රෙකෝඩින් සති දෙකක් කාලයක පමණක් රෙකෝඩ් වන බවත්, එහි එම කාලය වැඩි කර ගැනීම සඳහා 1TB හාර්ඩ් ඩිස්ක් එකක් දැමූ බවත්, ඔහු සවි කළ කැමරාවට ඔහු අලුතින් එක් කළ බිලෙහි රුපියල් තිස් හයදහස් ගණනක් තිබූ බවත්, ඊට කලින් බිලෙහි තිබූ අටදහස් ගණනත් සටහන් කර තිබූ බවත්, නමුත් එය නොදැක්ක බවත්, කලින් බිලෙහි තිබූ අටදහස් ගණන අඩු කර එහි සටහන් කර තිබූ බවත්,එදින විෂය නිලධාරිතුමා නොසිටි බවත්, පසුව එය විෂය නිලධාරිතුමා විසින් පැහැදිලි කර දුන් බවත්, 500GB හි මිල අඩු එහි තිබූ බවත්,එනම් හතලිස් හයදහස් ගණනින් අටදහස් ගණන අඩු කර එහි මිල සඳහන් කර තිබූ බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.වින්තක කරුණාරත්න මැතිතුමා.

මුදල් කමිටුවට රුපියල් 139000.00 කට පළමු බිල ඉදිරිපත් කළ බවත්, තමන් හා තමන්ට කලින් සිටි මන්ත්‍රිවරු හතර දෙනෙක් එය අත්සන් කළ බවත්, අත්සන් කර පසුව කියවා බැලූ බවත්, එම අවස්ාවේ එය කියවා එතනින් එය නැවැත්වූයේ නැත්නම්, තමාට පසුව සිටි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා බවත්අත්සන් කළා නම් එය විෂය නිලධාරී වෙත යොමු වෙන බවත්, ඉන් පසු ගෙවීම් කටයුතු සිදුවන බවත්, ඉන්පසු රුපියල් 39000.00 ක හෝ 36000.00 ක බිලක් ලැබුණු බවත්, එයද අනුමත කළා නම් එකම කාර්යක් සඳහා බිල් දෙකක් ගෙවීම් සිදු කරන බවත්, ඉන්පසු ඒ සම්බන්ධව සිදු වූ කිසිවක් නොදන්නා බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.වින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

විෂය නිලධාරී කැඳවා මේ සම්බන්ධව කරුණු විමසා සිටීම සුදුසු බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා

හදිසි අවස්ථාව එම උපකරණ ක්‍රියාකරන ආකාරයක් තිබෙන බවත් ආදාහනාගාර සේවකයන් දෙදෙනාට ගිණි නිවීමේ උපකරණ හා ආරක්ෂිත උපකරණ භාවිතය පිළිබඳව අවබෝධයක් නොමැති නම් ඒ සම්බන්ධව පුහුණුවක් ලබා දීම සුදුසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.වින්තක කරුණාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා පෙ.ව 11.25 ට සභා ගර්භයෙන් පිට විය.

රත්නපුර නගර සභාවේ ඒ සම්බන්ධ පුහුණු නිලධාරීන් සිටින බවත්, රත්නපුර නගරාධිපතිතුමා හා සාකච්ඡා කර ආදාහනාගාර නිලධාරීන්ට පුහුනුව ලබා දෙන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාටත් මේ සම්බන්ධව දැනුමක් පවතින බවත්, මන්ත්‍රිතුමාට එම කාර්ය සිදු කිරීමට හැකි නම් එම පුහුණු කාර්යන් අදාහනාගාර නිලධාරීන්ට ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගෑස් හා විදුලිය සමඟ ගැටෙමින් අවධානම් සහිත රැකියාවක් බැවින් ආදාහනාගාර සේවකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම ඉතාම වැදගත් බවත්, සේවකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කිරීම වෙනුවෙන් විශේෂ ස්තුතියක් පුද කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.26 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මහා සභාව කාරක සභාවක් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් එම යෝජනාව මම ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.27 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා
හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා පෙ.ව 11.28 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා පෙ.ව 11.29 ට සභා ගර්භයෙන් පිට විය
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.30 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා පෙ.ව 11.30 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා පෙ.ව 11.31 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.32 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මුදල් කාරක සභාවේ CCTV සම්බන්ධ වූ බිල්පත් විස්තරවලට අදාළ කරුණු මෙහිදී සාකච්ඡා කරන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා පෙ.ව 11.33 ට සභා ගර්භයෙන් පිට විය.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

15. (iii) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අයත් විලේගොඩ ආදාහනාගාරයේ සේවයේ යොදවා ඇති පී.එස්.සම්පත් ප්‍රේමජයන්ත (වැඩ ක්ෂෙත්‍ර කම්කරු), ඒ.ඩී.ප්‍රදීප් රෝහණ (සෞඛ්‍ය කම්කරු) යන සේවකයින් දෙදෙනා සහ ආදාහනාගාරය රක්ෂණය කිරීමට 2026.07.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී තීරණය කරන ලදී.ඒ අනුව එම රක්ෂණය සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.
මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

මේ සම්බන්ධව කතා කරන්නේ, මුදල් කාරක සභාවට සහභාගි වූ විට සභා රැස්වීමට පැමිණි විට යම්කිසි වැදගත් තීන්දු තිරණ ගත්තා, ඒ සඳහා ප්‍රකාශයන් කළා කිය සමාජයට දැන ගැනීමට තිබිය යුතු බවත්, සභාපතිතුමා ලේකම්තුමා ඇතුළු සියලුදෙනාම මේ රක්ෂණය සෞඛ්‍ය කම්කරුවන්ටද දිය යුතු බවට තීරණය කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පාන්දර 3.00 ට පමණ මාර්ග පිරිසිදු කාර්යේ නියලෙන පුද්ගලයන්ගේ වාහන අනතුරක් හෝ සිදු වුවහොත් දෛනික වැටුපක් ලබන ඔවුන්ට සභාව විසින් අනතුරු වන්දි ගෙවිය නොහැකි බවත්, මේ සේවකයින්ගේ සේවය සුරක්ෂිත කිරීමෙහිලා රක්ෂණයක් ලබා දීම සුදුසු යැයි මුදල් කමිටුවේ දී තීරණය වුවත් එය මුදල් කමිටු වාර්තාවේ ඇතළත් වී නොතිබුණු බවත්, ඒ පිළිබඳ මුදල් කාරක සභා වාර්තාවේ සටහන් නොවීම ගැන තමා විමසූ විට, ගරු උපසභාපති

යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා නිතර කියන එම ප්‍රකාශයම කළ බවත්, සෞඛ්‍ය කම්කරුවන්ට මාර්ග කම්කරුවන්ට හා ස්ථිර නොවූ සේවකයින්ට රක්ෂණයක් දීමට හැකියාව තිබේද යන්න සොයා බලා ඒ කටයුතු කරන ලෙස මේ ගරු සභාවෙන් ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා

මේ පිළිබඳව කටයුතු කිරීමට හැකිනම් ඒ සම්බන්ධව කටයුතු කරන බවත්, මෙය හොඳ යෝජනාවක් බවත්, ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

16. (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.

දිවුරුම්පිටිය වසමේ ගුණපාල මහතාගේ නිවස අසල සිට විමලාවතී මහත්මියගේ නිවස දක්වා දේදුනු මාවතේ සංවර්ධනය නොකළ මීටර් 50 ක් පමණ වූ කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
මෙම යෝජනාව .ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා පෙ.ව 11.37 ට නැවත සභාවට පැමිණෙන ලදී.

17. (i) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමය ගැටහැත්ත ජලයෝජනා ක්‍රමය හා ඒකාබද්ධ කිරීමේ දී අධික පිරිවැයක් දැරීමට සිදුවන බැවින් 2026.07.10 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිලි භූමියේ පවතින නල ළිඳ සක්‍රිය තත්ත්වයක නොමැති බැවින් අඛණ්ඩ ජල සැපයුමක් ලබා ගැනීමට තීරණය කරන ලදී.ඒ අනුව නැවත විධිමත් පරීක්ෂාවක් සිදු කර නල ළිඳක් ඉදිකිරීමට සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

දිවුරුම්පිටිය ගැටහැත්ත ඒකාබද්ධ කිරීමට හැදුවද ඒ සඳහා විශාල මුදලක් වැය වන බවත්, කැණීම කරනවට මාර්ග සංවර්ධන අධිකාරි පමණක් ඒ සඳහා ලක්ෂ 15 ක පමණ මුදලක් ඉල්ලූ බවත්, අමතර ලක්ෂ 30 ක් පමණ වැය වන බව ද, ඒ සඳහා විශාල මුදලක් වැය වන බැවින් බහුකාර්ය ගොඩනැගිලි භූමියේ විධිමත් පරීක්ෂාවක් සිදු කර නල ළිඳක් ඉදිකිරීමට මුදල් කාරක සභාවේදී තීරණය කළ බව ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

17. (ii) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

දිවුරුම්පිටිය පානීය ජල යෝජනා ක්‍රමයේ ජල සැපයුම් පද්ධතිය විධිමත් කිරීමට අදාළව 2026.07.10 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී නව ජල මනු 8 ක් අලුතින් සවි කිරීමටත් ජල මනු 5 ක් පවතින ස්ථානයෙන් ඉවත් කොට මනු කියවීමට පහසු ආකාරයට නැවත ස්ථාපිත කිරීමට තීරණය කරන ලදී.ඒ අනුව එම නිර්ණායක ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

17. (iii) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව සතු පානීය ජල යෝජනා ක්‍රම සක්‍රිය හා විධිමත් කිරීමට අදාළව 2026.07.10 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී පහත ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව යෝජනා කරමි.

- ❖ බේරුවාන ජල ව්‍යාපෘතියේ ජල රඳවන ටැංකිය සඳහා වැසි හා අව් ආවරණ පියස්සක් ඉදි කිරීම,
- ❖ බේරුවාන ජල රඳවන ටැංකිය තව අඩි 10 ක් උසින් ඔසවා තැබීම,
- ❖ දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමයේ අක්‍රියව ඇති ජල මෝටරය අලුත් වැඩියා කිරීම,
- ❖ දිවුරුම්පිටිය ළිඳ මත චේන් බොලොක්ක ආධාරකයක් ස්ථාපිත කිරීම,
- ❖ ජල මෝටර් කාමරයට නැගීම සඳහා මළ නොබැඳෙන යකඩ ඉනිමහක් සකසා සවි කිරීම,
- ❖ ළිඳ ආවර්ණ කවුලුව සුදුයකඩ යොදා ආවරණය කිරීම,
- ❖ ජල ටැංකියට ජලය ලබා ගන්නා නළ මාර්ගය නවීකරණය කිරීම,

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

17. (iv) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

ගැටහැත්ත පානීය ජල යෝජනා ක්‍රමයේ ජල සැපයුම් පද්ධතිය විධිමත් කිරීමට අදාළව 2026.07.10 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී ගත් තීරණය අනුව නව ජල මනු 24 ක් ස්ථාපිත කිරීමට හා ජල මනු තිබෙන ස්ථාන 20 ක් නැවත මනු කියවීමට පහසු වෙනත් ස්ථානයක ස්ථානගත කිරීමත් නව ජල මනු සවි කිරීමේ දී අඩි 2 1/2 ක් කොන්ක්‍රීට් කණු මත එම ජල මනු සවි කිරීමත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව . ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

17. (v) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

දිවිරුම්පිටිය පානීය ජල යෝජනා ක්‍රමයට අදාළව 2026.07.10 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී ගත් තීරණය අනුව ජල රැඳවුම් ටැංකියේ සැපයුම් නළයක බෙදුමක් ජල ටැංකිය අසලින් ම ඇති කර ගැනීමත් ගැටහැත්ත පානීය ජල යෝජනා ක්‍රමයේ ගැටහැත්ත අනුර විද්‍යාලය අසලින් ඇති ජල ටැංකියේ අදාළ ප්‍රතිසංස්කරණය සිදු කිරීමත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා

මෙහි බෙදුමක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසන ලදී.

ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

ටැංකියට ජලය සැපයීමට එක මාර්ගයක් පමණක් තිබෙන බවත්, තව නළ මාර්ගයක් ඇති කර ගබඩා කර තියන බවත්, හදිසි අවස්ථාවකදී ලබා ගැනීම මෙහි බෙදුමක් ලෙස හැදින් වූ ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා

ජල සම්පාදන මණ්ඩලයේ මාදොලින් ජල බවුසරයට ජලය ලබා ගන්නා බවත්, එහි ඇති ටැංකියෙන් පිටතට කරාමයක් සවි කර ඇති බවත්, එවිට සෘජුවම එම කරාමයට බටය ගසා එයින් බවුසරයට ජලය පුරවා ගත හැකි බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නියඟ කාලයක් පැමිණිය හොත් දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමයෙන් එවිට ජලය ලබා ගත හැකි බවත්, ඒ සඳහා පිටතට බටයක් ගැනීම මෙහිදී සිදු වන බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා පෙ.ව 11.42 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෙය ඉතාම හොඳ යෝජනාවක් බවත්, මේ සඳහා තැනක් වෙන් කරන ලෙසට පෙර පැවති සභාවකදී ද යෝජනා කළ බවත්, ඒ කාරණාව යෝජනාව තුළ සඳහනක් තිබුණා නම් හොඳ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

තාක්ෂණික ඇගයීමක් සිදු කර තිබේද යන්නත්, ජල ධාරිතාවය පිළිබඳ ප්‍රශ්න නැතිද යන්නත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් විමසන ලදී.

ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

ගැටහැතත යෝජනා ක්‍රමයේ ප්‍රශ්නයක් නොමැති බව ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

තාක්ෂණික ඇගයීමක් සිදු කර මෙම කාර්යන් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

17. (vi) ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 132 (ඒ) වගන්තිය මඟින් නිලධාරීන් හා සේවකයන් ආපදාවකට මුහුණ දුන් විට, ණයගැති වූ විට ඔවුනට සහන සැලසීම සඳහා අරමුදලක් පිහිටුවීමට, පවත්වාගෙන යාමට ණය දීමට වෙනම අරමුදලක් පවත්වාගෙන යාමට බලය දී ඇත.ඒ අනුව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ ආපදාණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ගෙවීම සඳහා නව ගිණුමක් ආරම්භ කිරීමටත් එම ගිණුම මඟින් උක්ත කාර්ය සිදු කිරීමටත් ගිණුමේ ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ලේකම් වෙත හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී වෙත බලය පැවරීමටත්, ගිණුම් කටයුතු ආරම්භ කිරීම සඳහා පොදු අරමුදලෙන් රුපියල් 2,800,000.00 ක මුදලක් ලබා දීමත් සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා.

දැනටත් මෙම ආපදා ණය ගෙවීම සිදු කරන බවත්, මේ සඳහා වෙන ගිනුමක් නොමැති බවත්, සභාවේ පවතින පවතින පොදු ගිණුම මඟින් මේ ගෙවීම් කටයුතු කරගෙන යාම සිදු වන බවත්, 4% පොලිය මත ලබා දෙන ණය මුදලක් බවත්, මෙහිදී යෝජනා කරනු ලබන්නේ සේවකයින්ගේ ආපදා ණය ලබා දීම සඳහා වෙනම ගිනුමක් පවත්වාගෙන යාම සුදුසු බව ගරු සභාපති බන්ධුලසෙන දුණුවිල මැතිතුමා විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා පෙ.ව 11.47 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

වැය ගිණුමේ වෙනම ශීර්ෂයක් යටතේ පවතින මෙය, ණය ලබා දීමේ දී පෙර පැවති කොන්දේසි මත පදනම්ව ලෙකම්තුමාගේ පරිපාලනය යටතේ වෙන ම ගිණුමක පවත්වා ගැනිමට මෙයින් යෝජනා කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ගිණුම මඟින් සිදු කරන්නේ ආපදාණය උත්සව අත්තිකාරම් ලබා දීම පමණ ද නැතහොත් වෙනත් සුභසාධක ණය තිබෙනවාද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විමසන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මේ සම්බන්ධව සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මහා සභාව කාරක සභාවක් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් එම යෝජනාව මම ස්ථිර කරන ලදී.

17. (vi) යෝජනාවට අදාළ කරුණු මෙහිදී සාකච්ඡා කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා ප.ව 12.04 ට සභා ගර්භයෙන් පිට විය.

උ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

i. මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තා -ඇමුණුම් ලේඛනය i / ii

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

විශේෂ සභා රැස්වීමට පසු දින හෙවත් ජූලි මස 31 දින පැවැත්වූ ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදි කිරීම සම්බන්ධ කෝටි දෙකයි විසිතුනක ටෙන්ඩර් විවෘත කළ බවත්, එම ප්‍රසම්පාදන වාර්තාව මෙහි ඇතුළත් වී නොමැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මහා සභාව කාරක සභාවක් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් එම යෝජනාව මම ස්ථිර කරන ලදී.

මේ අවස්ථාවේ වෙනත් කාර්යක් සඳහා විෂය නිලධාරී ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගොස් ඇති බවත් මේ සම්බන්ධ සවිස්තර වාර්තාවක් ලබන මස සභා රැස්වීමට ඉදිරිපත් කරන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් මෙහිදී දැනුම් දෙන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ii. නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව -ඇමුණුම් ලේඛනය iii
iii. මිලදී ගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව -ඇමුණුම් ලේඛනය iv/v
iv. පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව -ඇමුණුම් ලේඛනය vi

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප.ව 12.05 සභා ගර්භයෙන් පිට විය.

(ඌ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

i. 2026 ජූලි මස ආදායම් වියදම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය vii

ii. 2026 ජූලි මස හිඟ ආදායම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය viii
iii. 2026 ජූලි මස ගෙවීම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය ix

(ඒ) සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.

බෝපැත්ත සුසාන භූමිය අලුත්වැඩියා කිරීම ගිවිසුම්ගත මුදල රුපියල් හාරලක්ෂ හතළිස් නවදහසක් ද, වූ නමුත් 2026.04.07 වන දින සාමාන්‍ය රැස්වීම් වාර්තාවේ සඳහන් වූයේ රුපියල් පන්ලක්ෂ හතලිස් නවදහසක ව්‍යාපෘතික් වශයෙන් බවත්, නමුත් එය 2026.05.12 වන සාමාන්‍ය සභා වාර්තාවෙදී එම මුදල රුපියල් හාරලක්ෂ හතළිස් නවදහසක් ලෙස සංශෝධනය කර නිවරදි කළ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

එහෙත් බෝපැත්ත සුසාන භූමිය ව්‍යාපෘතිය සඳහා රුපියල් හාරලක්ෂ හතළිස් නවදහසක මුදල වෙනුවට රුපියල් පන්ලක්ෂ හතලිස් නවදහසක මුදලක් වියදම් කර ඇතැයි ප්‍රකාශයක් 2026.04.07 වන දින සාමාන්‍ය රැස්වීම් වාර්තාව පෙන්වමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රචාරයක් ගෙන යන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප.ව 12.07 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ඒ හේතුවෙන් තාක්ෂණික නිලධාරීතුමා හෝ මන්ත්‍රීතුමිය හෝ කාර්මික නිලධාරිතුමා හා මන්ත්‍රීතුමිය යන දෙදෙනාම එක්ව මේ මුදල ගසා කෑම කළ බවට බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ ජනතාව වැරදි ආකාරයෙන් නොමග යැවීමක් සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

එහෙත් බෝපැත්ත සුසානභූමිය අලුත්වැඩියා කිරීම සඳහා ගිවිසුම්ගත මුදල රුපියල් හාරලක්ෂ හතළිස් නවදහසක් ද, වැඩ වටිනාකම රුපියල් දෙලක්ෂ විසිතුන්දහස් එකසිය අනුදෙකයි ශත හතළිස් දෙකක් ද, ආරම්භ කිරීමට යෝජිත දිනය 2025.12.08 ද ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිත දිනය 2025.12.29 ද, ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී ආයතනය ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව වූ අතර කොන්ත්‍රාත්කරු මිනිමුතු සුභසාධක සමිතිය බවත්, ඒ සඳහා යම් විමසිමක් කිරීමට අවශ්‍යනම් දුරකතන අංකය ද සඳහන් කරමින් එම ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රදර්ශන පුවරුව සකස් කර ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව යම් තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් ප්‍රාදේශිය සභාවේ කාර්මික නිලධාරී මහතාගෙන් හෝ අදාළ විෂය නිලධාරී මහතාගෙන් හෝ ගරු ප්‍රාදේශිය සභා සභාපතිවරයාගෙන් විමසිමක් කළ හැකි බවත්, මෙවැනි වැරදිමත පැතිරවීම දැඩිලෙස හෙළා දකින බවත්, මෙවැනි වැරදි ප්‍රචාරයන් සිදු කිරීම නවතා බෝපැත්ත ගම සංවර්ධනය කිරීමට සහයෝගය ලබා දෙන ලෙසත්, මෙවැනි ක්‍රියාවන් නොකළ යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මිණිමුතු සුභසාධක සමිතිය කුමන ප්‍රදේශයේද යන්නත්, ග්‍රාම සංවර්ධන සමිතිය මේ සඳහා සහභාගි කරවා ගත යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.

මිණිමුතු සුභසාධක සමිතිය විලේගොඩ ප්‍රදේශයේ සමිතියක් බවත්, බෝපැත්ත ග්‍රාම සංවර්ධන සමිතිය අවුරුදු 10 ක් 15 ක් අක්‍රිය තත්ත්වයේ පැවති බවත්, මෙම ව්‍යාපෘතිය සිදු කරන අවස්ථාන වන විටත් බෝපැත්ත ග්‍රාම සංවර්ධන සමිතිය අක්‍රිය තත්ත්වයේ පැවති බවත්, දැනට මාස දෙකකට පමණ පෙර නැවත ග්‍රාම සංවර්ධන සමිතිය පිහිටුවීමට කටයුතු කළ අතර, නිලධාරී මණ්ඩලය නැවත අලුතින් පත් කර ගැනිමෙන් පසු සමිතිය සක්‍රිය කිරීමට කටයුතු කළ බවත්, ඉදිරියේ දී ප්‍රදේශයේ සිදුවන ව්‍යාපාතිය සඳහා ග්‍රාම සංවර්ධන සමිතියේ සක්‍රිය දායකත්වය ලබා ගැනිමට කටයුතු කරන බවත්, මේ සම්බන්ධව විමසීම් කළ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමාට ස්තුති කරමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ඒ සම්බන්ධව කරුණු පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.
2026.04.07 වන දින සාමාන්‍ය රැස්වීම් වාර්තාවේ රුපියල් පන්ලක්ෂ හතලිස් නවදහසක ව්‍යාපෘතියක් සිදු කළ බවත්, සඳහන් කරමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශයක් සිදු කළ ඇති බවට

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් සඳහන් කරන ලදි.ඒ අනුව එම කාලය තුළ බෝපැත්ත සුසාන භූමිය සඳහා ව්‍යාපෘතිය සඳහා රුපියල් පන්ලක්ෂ හතලිස් නවදහසක මුදලක් වියදම් කර ඇතැයි තමා විසින් ප්‍රකාශ කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් 2026.05.12 වන දින සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාවේ

“ගරු සභාපතිතුමනි, මෙම වාර්තාව සකස් කිරීමේදී ප්‍රකාශ කරන කරුණම මෙහි සඳහන් නොවී ඇති බවත්, එහිදි තමන් සඳහන් කළේ ගමේ අපිට උදව් කරනවා සියපත් මිතුරෝ කියල සමිතියක්.වාර්තාවේ සඳහන් වෙලා තියෙන්නේ,පරිසර මිතුරෝ කියල සමිතියක් කියලා. එය නිවැරදි කරන ලෙස ඉල්ලා සිටින බවත්, ඊට අමතරව රු.549,000.00 ක ව්‍යාපෘතියක් සිදු කළ බව සඳහන් වෙනවා .එය දැඩි ලෙස වැරදි.එය නිවැරදිව සඳහන් විය යුතුයි.මෙය ඉතාමත්ම වටිනා ලියවිල්ලක් නිසා එය රුපියල් 449,000.00 ක මුදලක් ලෙස නිවරදි විය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ඩී.ගයනී බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.”යනුවෙන් ප්‍රකාශයක් සිදු කළ ඇති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම වාර්තාව පැමිණි පසුව එම වයාපෘතිය සඳහා රුපියල් 449,000.00 ක මුදලක් වියදම් කළ බව තමා විසින් ප්‍රකාශ කල බවත්, රුපියල් 449,000.00 ක මුදලක් වියදම් කර සුසාන බිමේ කුමක් කළා දැයි ගමේ ජනතාව විමසා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පෙර වාර්තාවේ තණ කොළ නැති කරන බවත්, නමුත් අද එම ස්ථානයට ගියහොත් හරකෙකුට හැංගෙන්න පුළුවන් තරම් තණකොළ වැවී ඇති බවත්.මේ ආසන්න දින කිහිපයේ බෝපැත්ත දිද්ද ප්‍රදේශයේ අවමංගල්‍ය කිහිපයක් සිදු වූ බවත්, ඒ මිය ගිය පුද්ගලයින්ගේ ආදාහන කටයුතු සුසාන භූමියේ සිදු කළ බවත්, ඒ සෑම අවස්ථාවක ම සුසාන භූමිය සුද්ද කිරීමට සිදු වූ බවත්, රුපියල් 449,000.00 ක මුදලක් වියදම් කර කුමක් කළේ ද යන්න ප්‍රදේශවාසීන් විමසා සිටි බවත්, පරාල කිහිපයක් හා කැඩී ගිය කොටස් සකසා ඇති බවත්, සුසාන භූමියේ තිබූ කණුවලම තීන්ත ආලේප කර ඇති බවත්, එම ව්‍යාපෘතිය තුළින් සිදු කළේ යැයි දැක ගත හැක්කේ එපමණක් බවත්, මිනිසුන් ඒ පිළිබඳව අසන ප්‍රශ්වලට තමා පිළිතුරු දිය යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

බෝපැත්ත කොට්ඨාශය තුළ විදී පහන් සවි කරනු ලැබුවද තවත් විදී පහන් 18 ක පමණ ප්‍රමාණයක හිඟයක් තවම පවතින බවත්, එම බල්බ් නොදැමූ ස්ථානවල බල්බ් සවි කිරීමට අවශ්‍ය වන කොකුත් පවතින බවත්, බෝපැත්ත ග්‍රාමීය බැංකුව, සම්පකාරය හා තැපැල් කාර්යාලය යන ප්‍රදාන ම ස්ථානලවට බල්බ් සවි කර නොමැති බවත්, එම ස්ථානවලට ද බල්බ් සවි කර දෙන ලෙසත්, අක්කර 50 ප්‍රදේශයේ ප්‍රජාශාලාව අසල ද මෙතෙක් කල් කිසිදු බල්බ් එකක් නොදැමූ ස්ථාන ද තිබෙන බවත්, එම නිසා එම ස්ථානවලට ද අවශ්‍ය විදී පහන් සවි කර දෙන ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා ප.ව 12.15 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙම ව්‍යාපෘතියේ වැඩ වටිනාකම රුපියල් දෙලක්ෂ විසිතුන්දහස් ගණනක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් මෙහිදී සඳහන් කළ යුතු කාරණාවක් නොවන බවත්, එම ව්‍යාපෘතිය සම්බන්ධ තොරතුරු සඳහන් කරමින් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදා ඇති බවත්, එනැම ව්‍යාපෘතියක ඇස්තමේන්තු මුදල වැඩි බවත්, නමුත් කළ කාර්යන්ට අනුව කාර්මික නිළධාරී වාර්තාව අනුව වැඩ වටිනාකම සඳහා ගෙවීම් සිදු කරන බවත්, ඒ සම්බන්ධව තමාගෙන් හෝ මන්ත්‍රිතුමා ප්‍රශ්න කළා නම් ඒ සම්බන්ධව පැහැදිලිමක් කරන බවත්, මන්ත්‍රිතුමා විසින් සමාජය සමඟ කටයුතු කළ ආකාරයෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ඩී.ගයනී බුද්ධිකා මැතිණිය අපහසුතාවයට පත් වී ඇති බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා මෙහිදී ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

මීගස්වල මිහිඳු ඇළ ආසල මාර්ගය සුද්ද කර පස් ගොඩක් බෝක්කුකවෙල් දෙක අසල ගොඩ ගැසීම නිසා බෝක්කු කටවල් දෙක වැසී යාම හේතුවෙන් දංකුඹුර, කෝට්ටෙගොඩ හා බුළුගහපිටිය යන ප්‍රදේශ වර්ෂා දිනවල ජලයෙන් යට වේ.එමනිසා එම පස්ගොඩ ඉවත් කර එය පිළිසකර කර දෙන මෙන් ගරු සභාපතිතුමාගෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

ඇහැලියගොඩ NPP ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට ඇති විශාල පිහිඹිය ගස අවදානම් සහිත ගසක් බවත් එය ඉතා ඉක්මනින් කපා ඉවත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාවේ කතා කරන දේවල් බොහොමයක් වාර්තා නොමැති බවත්, සභාවේ කතා කරන සියල්ල වාර්තාවට ඇතුළත් කරන ලෙසත්, කුමක් හෝ ප්‍රශ්නයක් වූ විට ඉදිරිපත් කිරීමට කතා කළ දේ තිබිය යුතු බවත්, සභාවේ කාතා කරන වචනය වාර්තාවේ නැති වූ විට ලොකු අපහසුතාවයකට පත් වන බවත්, කියන දේ කියන විදිහට වාර්තා කරන ලෙසත්, ඒ සම්බන්ධව ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙසත් එමනිසා සභාවේ ප්‍රකාශ කරන සියල්ල වාර්තාවේ ඇතුළත් විය යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉදිරියේදී කයීන පිං කම් සිදු කිරිමට පවතිනබවත්, ගිය කයීන පිංකම් කාලයේ දී ද මේ සම්බන්ධව ප්‍රකාශ කළ බවත්, නමුත් මේවන තෙක් ඒ සම්බන්ධව කටයුතු කර නොමැති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා ප.ව 12.20 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සභාවේ කතා කරන විට සභාපතිතුමා ආමාන්ත්‍රනය කරමින් පනතේ 37 වගන්තිය අනුව කටයුතු කරන ලෙස සභාවේ සිටින සියලුම මන්ත්‍රිවරුන්ගෙන් හා මන්ත්‍රිවරියන්ගෙන් ඉල්ලා සිටින බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

බෝපැත්ත සුසාන භූමිය ව්‍යාපෘතිය සම්බන්ධව යම් ප්‍රචාරයක් සිදු වන බවත්, එම ව්‍යාපෘතිය සම්බන්ධ ඇස්ත මෙන්තුව තමා නොදැක්ක බවත්, ඒ නිසා ඒ සම්බන්ධව කරුනු සොයා බලා කියන්නම් කියා තමා ගම්වැසියන්ට ප්‍රකාශ කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය ප්‍රකාශ කල පරිදි එවැනි පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සුදුසු බව තමා ද සිතන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.
බෙරුවාන කසල අංගනය සම්බන්ධව කතා කළත්, එයින් විශාල තර්ජනයක් ගම්වාසින්ට තිබෙන බවත්, මේ සම්බන්ධව මීට පෙර සභාවකත් මන්ත්‍රී පැහැදිලි කිරීම් අවස්ථාවේ අදහස් ප්‍රකාශ කළ බවත්, බෙරුවාන කසල අංගනයේ බැවුම පහළ ප්‍රදේශයේ ඇළක් තිබෙන බවත්, බැකෝ යන්ත්‍රය මඟින් කසල එහා මෙහා කිරීමේ දී පොලිතින් ද සමඟ කසල එම ඇළට වැටී ඇති බවත්, ඉහළ සිට බැලූ විට එය නොපෙනෙන නිසා ඇළ පැත්තෙන් ගොස් බැලුවිට එය විශාල පරිසරහානියක් ලෙස දැකගත හැකි බවත්, ඒසම්බන්ධව අවධානය යොමු කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගියවර වාර්තාවේ දෙතැනක සභාවෙන් පිටව ගිය සඳහන් ව ඇතැත්, නැවත සභාවට පැමිණිමක් සඳහන් ව නැති බවත්, එය සටහන් කිරීමේ දී ඒ සම්බන්ධව ද සැලකිලිමත්වන ලෙස ප්‍රකාශ කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී'

මාර්ගයක් සම්බන්ධව තොරතුරු ලබා දුන් බවත්, මහින්ද රාජා නැමැති පුද්ගලයා NPP පාක්ෂිකයෙක් බවත්, තමා සමඟ පුද්ගලික වචන හුවමාරු කර ගන්නා පුද්ගලයෙක් බවත්, මේ ක්‍රියාව තුලින් පොදු නාන ළිඳට යන මාර්ගය අහිමිව යන බවත්, ඒ සම්බන්දව අවදානය යොමු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.සබාවෙන් එම ස්ථානයට ගිය විට එක් කාරණයක් ප්‍රකාශ කළ බවත්, නමුත් ජනාධිපතිලේකම් කාර්යාලයට ප්‍රකාශ කර ඇත්තේ වෙන ම කාරණයක් බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමා විසින් මහින්ද රාජා කියන පුද්ගලයා දැනුවත් කර ඇත්තේ මේ කාරණය සම්බන්ධව නිරවුල් කිරීමක් කළ දෙන බවත්, ඒ නිසා සභාව පැත්තෙන් ලොකු වැරද්දක් ඒ පුද්ගලයාට සිදු කර ඇති බවත්, ඒ සම්බන්ධව අවධානය යොමු කර මේ සම්බන්දව තොරතුරු දන්වන ලෙසට ඉල්ලීම කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී'

හොරගොඩ මෝරගල මාර්ගයේ මාන පඳුරු වැවී ඇති බැවින් ගමන් කිරීමට අපහසු තත්ත්වයක් මේ වන විට ඇති වී තිබෙන බවත්,මේ සඳහා උපකර්ණ රැගෙන මානපදුරු සුද්ද කර දෙන්නම් කියා ලේකම්තුමා විසින් මීට මාස දෙකට පමණ පෙර ප්‍රකාශ කල බවත්, ශ්‍රමදානයක් සිදු කර එම මාන පඳුරු ඉවත් කළ නොහැකි බවත්, ඒ සම්බන්ධව ද අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලීමක් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී'

ප්‍රාදේශිය සභාවේ පළමු මහළේ වැසිකිලිය සම්බන්දව ඡායා රූපයක් ද සමඟ සමාජ මාධය තුළ පළ වූ බවත්, වැසිකිලි පද්ධතිය සංවර්ධනය කිරීම සම්බන්ධව යෝජනාවක් සම්මත වුවා ද කියා තමාට හරි හැටි මතක නැති බවත්, සමුපකාර ඡන්ද සම්බන්ධව විශාල ප්‍රචාරයක් ලබා දුන් නමුත් සභාවේ තත්ත්වය මේ වගේ කියා සමාජ මාධ්‍ය තුළ සභාවට හානියක් වන දෙයක් වූ බවත්, ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී'

ඇහැලියගොඩ පොලිසියට ගිය විට වහින විට තෙමෙන බවත්, මහජනතාවට වැසි අවස්ථාවක සිටීමට ස්ථානයක් නොමැති බවත්, එහි සේවකයින් සේවය සපයන්නේ පුංචි කාමරවල සිට හරිම අපහසුතාවයකින් බවත්, ඒ නිසා පොලිසිය සංවර්ධනය කරන ලෙස ද යෝජනා කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප.ව 12.25 ට සභා ගර්භයෙන් පිට විය.

හුනුගෙවත්ත අස්ගගුල මාර්ගයේ තාප්පයක් පුපුරා යාම සම්බන්ධව ගියවර සභාවේදී ප්‍රකාශ කළ බවත්, ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගය කුමක්ද කියා දැන ගැනීමට කැමත් බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ විෂය නිලධාරීන් ලිපියක් මඟින් දැනුවත් කළ බවත්, එහි පිටපතක් මන්ත්‍රීතුමිය වෙත ද යොමු කර ඇති බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා ප.ව 12.26 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෝරගල හන්දියේ ලොරියක් අනතුරකට ලක්වීමෙන් හානි වූ කඩ කාමරයක කොටස් මාර්ගයට අවහිරයක් වන ලෙස තිබෙන බව ගියවර සභාවේ දී තමා විසින් දැනුවත් කළ බවත්, එය අශෝබන් තත්ත්වයක් වගේ ම මාර්ගයේ ගමන් ගන්නා මඟින්ට එය අවහිරතායක් බවත්, ඒ සම්බන්ධව නඩු කටයුත්තක් සිදු වුවත්, අධිකරණය ද දැනුවත් කර ප්‍රාදේශිය සභාව මැදිහත් වි එම අවහිරතාව ඉවත් කර දෙන ලෙස ඉල්ලීමක් කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෝරගල සිට ඇහැලියගොඩ පැමිණීමේ දි මාර්ගය පැත්තක කළු ඉටි කර ගසා කුමක් හෝ කටයුත්තක් සිදු කරනවා ය කියා ගියවර සභාවේ ප්‍රකාශ කළ කාරණාව සම්බන්ධව කටයුතු කරන බව දන්වා තමාට ද ලිපියක් යොමු කළ බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. තමා දැනුවත්ව තමන්ටග් ආණ්ඩු සමයේ නගර සංවර්ධනය සඳහා එම ඉඩම් අත්පත් කර ගත් බවත්, එම ඉඩම් අත්පත් කර ගැනීමේ දී ඉඩම් තක්සේරු කර වන්දි ලබා දීමේ ක්‍රියාවලිය තුළ මිනිසුන්ගේ ප්‍රසාදයක් වගේම අප්‍රසාදයක් ද පවත්න බවත්, එතුමා විසින් ප්‍රකාශ කරන ලදී.නමුත් දැන් ඉඩම් අයිති අයද වෙන යම් අද කියන්න දන්නැ, තමන්ට ඕන ඕන ආකාරයට යම් යම් ඉදිකිරීම් කරන බවත්, මේ කාරණය ප්‍රකාශ කිරීම තමාට අවාසිදායක තත්ත්වයක් බවත්, නමුත් පොදු ජනතාව ගැන සිතා මෙය ප්‍රකාශ කළ යුතු බවත්, හිතුමතේ සිදු කරන ඉදි කිරීම් සඳහා අවස්ථාව නොදිය යතු බවත් ඒ සඳහා සභාපතිතුමා හවුල් සභාපතිතුමාගේ ආණ්ඩුව හවුල් කියන මතය සමාජය තුළ ප්‍රචාරය වන බවත්, ඉදිරියේ දී තමන්ගේ ආණ්ඩුවක් පිහිටුව හොත් එය ප්‍රශ්නයක් වන නිසා ඒ නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ආණ්ඩුවේ මන්ත්‍රිවරු නියෝජනය කරන අනෙකුත් වසම්වල ග්‍රාමීය සංවර්ධන කටයුත් සිදු වුවත්, පැල්පිටිය මෝරගල වසම්වල ගම් ඇතුලේ සංවර්ධන කටයුතු සිදු වන බවත්,ලක්ෂ 10, ලක්ෂ 5 වගේ පොඩි පොඩි සංවර්ධන ව්‍යාපෘති ජේන ජේන තැන්වල පමණක් උපසභාපතිතුමා ගිහින් සිදු කරන බවත්, නමුත් ගම් ඇතුලේ සංවර්ධනය විය යුතු පමුඛතාව දිය යුතු කාරණා සම්බන්ධව අවදානය යොමු වී නොමැති බවත්, කලින් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපාතියක් කළත්, එහිදී පුමුඛතාවය අනුව ද මේ ව්‍යාපෘති කරන්නේ කියන එක තමාට ප්‍රශ්නයක් තිබෙන බවත්, තමා දන්න විදිහට එය සිදුවන්නේ ප්‍රමුකතාව අනුව නොවන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මින්නාන වෙලන්ගල්ල මාර්ගයේ වරිපනම් බදු සභාව විසින් අය කරන බවත්, නමුත් ඒ ජනතාවගේ අවශ්‍ය පහසුකම් සපයන් නෑ කියා එම ගම්වාසීන් විසින් ප්‍රකාශ කළ බවත්, ඒ සම්බන්ධව ද අවධානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

රජය ගත් ක්‍රියාමාර්ගයක් වන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ හා අභියාචනා විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස වැඩි කිරීම සම්බන්ධව ගම්වල මහජනාව කතා කරන බවත්, තමා දැනුවත් වී සිටින ආකාරයට තම ප්‍රදේශවාසීන්ගේ සම්බන්ධව කැමැත්තක් නොමැති බවත්, ඒ සම්බන්ධව කැමති නැති බව ප්‍රකාශ කිරීමට ආණ්ඩුව විසින් අවස්ථාවක් සකසා දීමට කටයුතු කරන ලෙසත්, මේ ආණ්ඩුව පැමිණෙන විට ගම්වල තරුණ තරුනියන් ප්‍රකාශ කළේ මහලු අයට ආයේ ගෙදර යතුරවත් ලබා නොදෙන බවත්, තරුණ ජවයක් සමඟ මේ ආණ්ඩුව පිහිටවන බව ප්‍රකාශ කළ බවත්, නමුත් අද ආණ්ඩු නැවත වයසක අයට යතුර ලබා දීමට කටයුතු කරන බැවින්.ඒ අය සමාජයට මුහුණ නොදෙන බවත්, මේ

ආකාරයට සිදු කිරීමෙන් රැකියා බලාපොරොත්තු වන තරුණ තරුණියන්ට අසාධාරණයක් බවත්, කුමක් හෝ හේතුවක් නිසා රජයේ සේවකයෙකුගේ විශ්‍රාම වයසක් තීරණය කර ඇති බවත්, ඒ සඳහා අනුගත විය යුතු බවත්, තමන්ගේ වාසියට පමනක් වැඩ කටයුතු සිදු නොකළ යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඇහැලියගොඩ විවිධසේවා සමුපකාර සමිතියේ මහ සභා නියෝජිතයින් තෝරා ගැනීමේ මැතිවරණය අගෝස්තු මස 02 තිබූ බවත්, මෝරගල කාරක සභා ප්‍රාදේශිකයේ මාලිමාව නියෝජනය කළ සමරපාල මහතා ඇතුළු කණ්ඩායම ජයග්‍රහණය කරවීම සඳහා සාමාජික නොවන උපසභාපතිතුමා එහි විශාල කාර්ය භාර්යක් සිදු කළ බවත්, මාලිමාවේ ප්‍රබලයන් පැමිණ ඡන්දය ලබා දෙන පිරිසට යම් බලපෑමක් කළ බවත්, මාලිමාවේ කොටඨාශ සභා හා මාලිමාවේ රැස්වීම් පවත් වන මාලිමාවේ ප්‍රභලයෙක්ගේ නිවසේ ම මෙම සමුපකාර මැතිවරණයේ ඡන්දය ද පැවැත් වූ බවත්, එය සුදුසු නොවන ක්‍රියාවක් බවත්, ඒ සම්බන්ධව සභාව පැත්තෙන් යම් කාර්යක් සිදු කිරීමට හැකි නම් ඒ සම්බන්ධව ද කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා ප.ව 12.35 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

සමුපකාර ඡන්දය සම්බන්ධව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද ප්‍රකාශයට තමාගේ අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධ කරන බවත්, තම කොටඨාශයන්ගේ ද සමුපකාර ඡන්දය පැවැත් වූ බවත්, ගියවර මැතිවරණවලදී ගහමරා ගත් පිරිස පැමිණ හොර ඡන්ද ප්‍රකාශ කිරීම් වැනි දේ සිදු කළ බවත්, සමුපකාරයවත් දිනා ගැනීමට නොහැකි වුවහොත් අපේ මැතිවරණය මෙතනින් අවසන් බව සමහරු ප්‍රකාශ කළ බවත්, මෙතෙක් ඉතිහාසයේ සමුපකාර මැතිවරණයක් සඳහා මෙවැනි උනන්දුවක් දැක නැති බවත්, එකම මන්ත්‍රිවරයෙක් තුන්වතාවක් ඡන්දය ප්‍රකාශ කළ බවත්, තාත්තාගේ නම හා පුතාගේ නම යන නම් කිහිපයකින් ඉදිරිපත් වූ බවත්, එහිදී තම කණ්ඩායම යම් විරෝධතාවයක් ප්‍රකාශ කළ බවත්, ආණ්ඩු බලය තමාගෙන තම පක්ෂය එහිදී මහත්මා ගතිය රදවාගෙන කටයුතු සිදු කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද විනිශ්චයකාර තනතුර පිලිබඳවද තමා අදහසක් ඉදිරිපත් කරන බවත්, මේවන විශාල නඩු කටයුතු ප්‍රමාණයක් එක්රැස් වී ඇති බවත්, මේවන විට සෙනසුරාදා ඉදිරිදා දිනවලද නඩු කටයුතු විමසීම සිදුවන බවත්, විනිශ්චයකාර තනතුරට බඳවා ගැනීමට යම් කාලයක් යන බවත්, ඉදිරියේදී දේශපාලනය සිදු කිරීමට පුද්ගලයින් නැතිවේය කියන බිය ඇති වී තිබෙන බව තමාට සිතෙන බවත්, (සෝෂාව) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා ප.ව 12.38 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.

ආදාහනාගාර සේවකයින් ගෑස් හා විදුලිය සමඟ කටයුතු සිදු කිරීමේ දී ජීවිත අවධානමක් තිබෙන බවත්, එම සේවකයින් දෙදෙනාට රක්ෂණාවරණයක් ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බවත්, ගිනි නිවන උපකරණ ලබා දීම, CCTV සවි කිරීම වැනි සේවකයින්ට පහසුකම් ලබා දීම තුළින් ඔවුන්ගෙන් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීමට හැකි බවත්, ඒ තුළින් එම සේවකයින් දෙදෙනා කාර්යක්ෂම සේවයට අනුගත වේයැයි තමා බලාපොරොත්තු වන බවත්, ශ්‍රමදාන පවත්වා පිරිසිදු කරනකන් නොසිට එම ස්ථාන පිරිසිදුව තබා ගන්නා ලෙස ලේකම්තුමා විසින් ද දැනුවත් කිරීම් සිදු කර ඇති බවත්,තමා ද සතියක සැරයක් එම ස්තානයට යන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විලේගොඩ සිදු කරන ව්‍යාපෘතිය සම්බන්ධව අඩු පාඩු පෙන්වා දුන් බවත්, ඒ සම්බන්ධව දැන්වීමක් ප්‍රදර්ශනය නොකළත් ගම්වාසීන් සියලු දෙනා දැනුවත් කළ බවත්, සමහර විට එක්නෙක් හෝ දෙන්නෙක් අතපුවීමක් වෙන්නත් ඇතැයි එතුමා ප්‍රකාශ කරන ලදී.ඉදිරියේදී එවැනි අපහසුතා නොවෙන්න කටයුතු කරන බවත්, තාම එම ව්‍යාපෘතියේ වැඩ අවසන් නොමැති බවත්, වැඩ අවසන් වන විට ඒ සියලු දේ තාක්ෂනික උපදෙස් මත සිදු කරන බවත්, එහි අඩු පාඩු පෙන්වාදීම ගැන ස්තුතිවන්ත වන බවත්, එම මාර්ගයේ කාණු පද්ධතිය සුද්ද කිරීම සඳහා මුදල් හා බැකෝ යන්ත්‍රය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බවත්, ඒ සඳහා මුදල් ලැබුණු විට එම ප්‍රදේශයේ ජනතාව සමඟ පැමිණෙන ඒ සඳහා සහයෝගය ලබාදෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාට ආරාධනා කරන බවත්, වසම් දෙකේ ජනතාව සඳහා බේදයක් නොකරන බවත්,ග්‍රාමීය සංවර්ධන යෝජනා ප්‍රමුඛතාව අනුව සංවර්ධන ව්‍යාපෘතිය තෝරා ගෙන ඇති බවත්, ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් ප්‍රමාණය අනුව ව්‍යාපෘති මාරු වන අවස්ථා තිබෙන බවත්, එසේ නැත්නම් ග්‍රාමීය සංවර්ධන යෝජනා අනුව ම කටයුතු කරන බවත්, අමතර යෝජනා ලබා දීමට අවස්ථාව තිබෙන බවත්, ඉදිරියට සංවර්ධන යෝජනා සිදු කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොළ භූමියේ තිබෙන ගස අවධානම් ගසක් කියා පොළ භූමියට යන හැම අවස්ථාවකම එහි සිටින ජනතාව ප්‍රකාශ කරන බවත්, ලියාපදිංචි වූ ගස් කපන්නන් ගණනාවක් මේවන විට සිටින බැවින් ටෙන්ඩර් කැඳවීම ඉක්මන් කර එම කටයුත්ත කඩිනමින් කළ යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කාණු පද්ධතිය සුද්ද කිරීම සඳහා බැකෝයන්ත්‍රය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බවත්, බෝක්කුව සකස් කිරීමේ කටයුත්ත අවසන් වූ පසු සංවර්ධන යෝජනාවේ නිසි ප්‍රතිඵල ලැබෙන බවත්, ඒ සඳහා මුදල් අනුමත වී ඇති බවත්, එම කටයුත්ත ද ඉක්මනින් සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.

මෝරගල මහජන ක්‍රීඩාංගනයේ කාණු පද්ධතිය සුද්ද කර දෙන ලෙස වර්ෂයක පමණ සිට කරන යෝජනාවක් බවත්, බැකෝ යන්ත්‍රය මේවන විට සකසා ඇති බවත්, එමනිසා බැකෝයන්ත්‍රය යොදා එම කටයුත්ත සිදු කර දෙන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී. ප්‍රදේශයේ කාන්තාවන් පිරිසක් කැඳවා කාණු පද්ධතිය සුද්ද කර දෙන බවට පොරොන්දු වෙමින් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් රැස්වීමක් පැවැත් වූ බවත්,එම කටයුත්ත සිදු කරන්නැද්දැයි ඒ අය දැන් තමාගෙන් ප්‍රශ්න කරන බවත්, (සෝෂාව) එම රැස්වීම සඳහා කොට්ඨාශ සභාවේ මන්ත්‍රිවරු එම අවස්ථාවට පැමිණ සිටි බවත්, තමන්ගේ යෝජනා ක්‍රියාත්මක නොකරනවා නම් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාවක් මඟින් හෝ එම කටයුත්ත සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තමන් විසින් මීට ඉහත දී ප්‍රකාහ කළ වැවිල ප්‍රදේශයේ කොන්ක්‍රීට් මාර්ගයේ ත්‍රිවිල් එකක් ගමන් කරන විට පයින් ගමන් ගන්නා පුද්ගලයෙකුට යැමටවත් නොහැකි බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ද එම මාර්ගය සකස් කළ යුතු බවට ප්‍රකාශ කළ ද මේවන තෙක් එම යෝජනාව ක්‍රියාත්මක නොවූ බවත්, ඒ සඳහා රුපියල් ලක්ෂ 2 ක 3 ක් පමණ වැය වන යෝජනාවක් බවත්, ඒ සම්බන්ධව ද අවදානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

මහජන නියෝජිතයින්ට හා නිලධාරින්ට පනත පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙසට තමා සබාවට පැමිණි දින සිට ප්‍රකාශ කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප.ව 12.45 ට සභා ගර්භයෙන් පිට විය.

කාර්යාලයේ වරිපනම් බදු මුදල් ලබා ගන්නා ස්ථානයට පුද්ගයෙකුගේ ප්‍රශ්නයක් විසඳීමට ගිය විට මහත්තයා මහත්තයා කියා තමාට අමන්ත්‍රණය කළ බවත්, ඒ අවස්ථාවේ තමා මන්ත්‍රිවරයෙක් ලෙස හඳුන්වා දුන් බවත්, යහපත් ගණුවත් සමහර නිලධාරින් ද සිටින බවත්, මන්ත්‍රිවරු පත්වී වසරක් පමණ වී ඇති බැවින් මන්ත්‍රිවරුන් කවුද කියා හඳුනාගෙන සිටිය යුත්තු බවත්, එමනිසා කතා කිරීම සම්බන්ධවත් නිලධාරීන් දැනුවත් කරන ලෙස ලේකම්තුමාගෙන් ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

බෝපැත්ත කොට්ඨාශය සම්බන්ධව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.වන්ද්‍රදාස මැතිතුමා විසින් කළ ප්‍රකාශයේ දී ඒ සම්බන්ධව දැන්වීම් පුවරුව සවි කළ විට එම ප්‍රශ්නය නිරාකරණය වන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගමේ වැඩක් කරන විට ග්‍රාම සංවර්ධන සමිතියත් හෝ සුසාන භූමියක් නම් අවමංගල්‍යාධාර සමිතියත් මුල් වී ඒ සම්බන්ධ කටයුතු කළ යුතු බවට චක්‍රලේකයක් තිබෙන බව ලේකම්තුමා විසින්ද පැහැදිලි කිරීමක් කළ බවත්, එහෙත් එම ව්‍යාපෘතිය සිදු කළ ඇත්තේ වෙනත් සමිතියක් මඟින් බවත්, එම සමිතිය අදාළ වසමේ සමිතියක් නොව වෙනත් වසමක සමිතියක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

බිසෝදොළ පැති බැම්ම සකසා ඇති ස්ථානයේ නාම පුවරුවේ අස්ගගුල දකුණ ලෙස සටහන්ව ඇති මින් පෙර සභාවක ද ප්‍රකාශ කළ බවත්, එය අස්ගගුල උතුර ග්‍රාම සේවා වසමට අයිති බවත්, ඒ සම්බන්ධව සමාජ මාධ්‍යවලත් එය නොදැමූ බවත්, ඔබතුමාල නම් එය අනිවාර්යෙන් ම සමාජ මාධ්‍යවලට යොමු කරන බවත්, එම කාරණය සම්බන්ධව සභාවේ ප්‍රකාශයක් කරන ලෙසත් එවිට එය ගලවා දැමීමට ලේකම්තුමාට බලයක් ඇති බවත් ලේකම්තුමා ප්‍රකාශ කළ බවත්, ඒ

අනුව පසුව එම පුවරුව එම ස්ථානයෙන් ගලවා ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා ප.ව 12.48 ට නැවත සභාවට පැමිණෙන ලදී.

අදටත් අස්ගගුලේ එක් ස්ථානයක පොළබුයේ කියා තිබෙන බවත්, අස්ගගුල විමලරතන බෞද්ධ මධ්‍යස්ථාන මාර්ගය ලෙස සඳහන් කරන් නැතිව එම නම යොදා ඇති බවත්, අස්ගගුල විමලරතන බෞද්ධ මධ්‍යස්ථානය හරහා දිවෙන මාර්ගය යනුවෙන් සටහන් කලේ නම් එය මිනිස්සු දන්නා බවත්, නමුත් එහි සටහන් කොට ඇත්තේ පොළ බුයේ සිට එන මාර්ගය ලෙස බවත්, මාර්ග නම් කිරීමේ දී ජනවහරේ භාවිතා වන වචනය යොදා ගතයුතු බවත්, මේ වැරදි නිවරදි කරගෙන යායුතු බවත්, එසේ නොවෙනවා නම් මේ ගමන ඉදිරියට යැමට නොහැකි බවත්, තමන් ඇතුළු කණ්ඩායම නිවරදි මාර්ගය පෙන්වා දෙන බවත්, ගරු උපසභාපතිතුමා ද මේ සම්බන්ධව අවධානය යොමු කළ යුතු බවත්, ගරු සභාපතිතුමා නිවරදි නායකත්වයක් සපයන නිසා තමන් ඇතුළු පිරිස විරුද්ධව පෙළ නොගැසෙන බවත්, ගරු සභාපතිතුමා දෙපැත්තම බැලැන්ස් කරන් ලස්සන ගමනක් අරන් යන විට ඒ ගමන පස්සෙන් අදින් නැතුව නිවරදි දේ කියා දෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඇහැලියගොඩ ඔසුහලක් අවශ්‍ය බව එක් අවස්ථාවක තමා යෝජනා කළ බවත්, එය විෂය පථයට අදාළ නැ කියා එය ඉවත් කළ බවත්, දැනට ඇහැලියගොඩ තිබෙන ෆාමසි කියක් තිබේද? ප්‍රාදේශිය සභාවට බදු මුදල් ලබා දෙන ෆාමසි කියක් තිබේද යන්න එතුමා විසින් ප්‍රශ්න කරන ලදී.තමාගේ මතකේ හැටියට ප්‍රාදේශිය සභා සිමාවේ ෆාමසි 32 ක් පමණ තිබෙන බවත් ඉන් ෆාමසි 8 ක් පමනක් බදු ගෙවන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සංවර්ධන යෝජනා ගෙනත් කතා කළත් ඒ යෝජනා ලබා දෙන්නෙත් නැත්නම්, සමස්ත ඇහැලියගොඩ ජනතාව වෙනුවෙන් පොදු යෝජනා ගෙනෙන විට ඒවාටවත් ඇහුන්කන් දෙන ලෙස ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා වසර ගණනාවක් ප්‍රාදේශිය සභාව නියෝජනය කළ මන්ත්‍රිවරයෙක් විදිහට ඔබතුමාගේ ගමන් මහට ශක්තියක් වන්නට එතුමා අදහස් ප්‍රකාශ කරන බවත්, වාර්තාව සකස් කිරීමේ දී මහජන නියෝජිතයා කතා කළ දේ සටහන් කරන ලෙස එතුමා නිරන්තරයෙන් ප්‍රකාශ කරන බවත්, නමුත් එය තාම සිදු නොවන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තමා සභාවට පැමිණීමට ප්‍රමාද වු නිසා මේ සම්බන්ධව කතා කිරීමට මෙ වෙලාවේ අවස්ථාවක් කර නොගන්නා බවත්, එය පෙර කතා කළ යුතු කාරණාවක් බවත්, නමුත් මහජන නියෝජිතයින් 13 දෙනෙකු අත්සන් කළ ලිපියක් සභාවට යොමු කළ විට එය වෙනත් කතාවලට දැමීමට නොහැකි බවත්, ඒ පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අගෝස්තු මස 02 වැනි දා ඇහැලියගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රාදේශිකවල නිලවරණය තිබු බවත්,ආරියදාස මන්ත්‍රිතුමා තමාගේ ගුරුවරයා බවත්, මෙතන දී මඩගැසීමක් සිදු නොකරන බවත්,මහපොළවේ සිටින මිනිසුන් විදිහට ගරු මාලින්ද මන්ත්‍රිතුමා ඇතුළු පිරිස එකතු වී වැඩ පිළිවෙළක් සකස් කළ බවත්,එය ප්‍රසිද්ධ නොකර උපක්‍රමශිලිව එය සිදු කල බවත්, එහිදී අංක 13 බුලුගහපිටිය ප්‍රාදේශිකයේ මහ සභා නියෝජිතයින් 3 දෙනාම පොදු විපක්ෂයෙන් පත්කර ගැනීම වෙනුවෙන් බුලුගහපිටිය ප්‍රාදේශිකයේ සාමාජිකයන්ට ස්තුති කරන්න මෙය අවස්ථාවක් කර ගන්නා බවත්, ඒ වගේ ම අංක 15 යකුදාගොඩ ප්‍රාදේශිකයේ මහ සභා නියෝජිතයින් 4 දෙනෙක් පත් කර ගත් බවත්, යකුදාගෙඩ ද ජාතික ජනබලවේගය පරාද කරමින් 4 දෙනා ම පොදු විපක්ෂයෙන් පත් වු බවත්, යකුදාගොඩ ප්‍රාදේශිකයේ සාමාජිකයන්ට ද ස්තුති කරන්න මෙය අවස්ථාවක් කර ගන්නා බවත්, සමගි ජනබලවේගය, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා මහජන පක්ෂය, සර්වජන බලය පක්ෂය, මහජන එක්සත් පෙරමුණ පක්ෂය, ස්වාධින කණ්ඩායම් යන පක්ෂ එකතු කර ගෙන පවතින ආණ්ඩුවේ බලය අප සතුයි කියා ඔප්පු කිරීමට අවස්ථාවක් ලැබුණු බවත්, ඒ වෙනුවෙන් කැප වුණු හිටපු අමාත්‍ය ජානක වක්කුඹුර ඇමතිතුමාට, රත්නපුර පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන ලියනගේ මන්ත්‍රිතුමාට, රත්නපුර දිස්ත්‍රික් මහජන පක්ෂ නායක දිලීන් කරුණාපාල මන්ත්‍රිතුමාට, ගරු රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රිතුමා ඇතුළු සියලු දෙනාටම ගෞරවනීය ප්‍රනාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා ප.ව 12.51 ට සභා ගර්භයෙන් පිට විය.

ඒ අවස්ථාවේ දී ප්‍රාදේශික 30 තුළ වැඩිම මහ සභා නියෝජිතයින් පිරිසක් පත් කර, ඇහැලියගොඩ විවිධ සේවා සමිතියේ 2008 තමා හිටපු උපසභාපති බවත්, 2008 රංජිත් වික්‍රමසිංහ මහත්මා ඡන්ද 102 ගන්නා විට තමා ඡන්ද 100 ක් ගෙන උපසභාපති වූ බවත්, තමා සමුපකාරවලට ආදරය කරන මනුස්සයෙක් බවත්, සමුපකාර නිසා තමා 2011 මැතිවරණයේ දී ලංකා ඉතිහාසයේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා අපේක්ෂකයෙක් ප්‍රථමවතාවට ඉදිරිපත්වෙලා සමුපකාරයට පිං සිද්ද වෙන්න ඡන්ද 7079 ක් ගත් බවත්, ඒ නිසා සමුපකාරයට අදත් ගරු කරන බවත්, මෙවර සමුකාර ඡන්දයේ දී තමා ඒ ස්ථානයට නොගිය බවත්, තමා මේ කාර්ය අවංකව සිදු කළ බවත්, සමුපකාර ඡන්දයෙන් පොදු විපක්ෂයට වැඩිම නියෝජිත පිරිසක් පත් වූ බවත්, ඒ සාමාජික සාමාජිකයන්ට ස්තුති කිරීමට ද මෙය අවස්ථාවක් කර ගන්නා බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ප.ව 12.54 ට සභා ගර්භයෙන් පිට විය.

පසුගිය සභාවාරයෙන් පසුව මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා සමඟ සාකච්ඡාවක් සිදු කර යම් වැඩපිළිවෙළක් සකස් කර ගත් බවත්, ඒ සම්බන්ධව ද අවධානය යොමු කරන බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා ප.ව 12.55 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා ප.ව 12.55 ට සභා ගර්භයෙන් පිට විය.

පසුගිය සතියේ ඉන්දිය විදේශ කටයුතු ලේකම්තුමා ලංකාවට පැමිණ අති ගරු ජනාධිපතිතුමා සමඟ හා විපක්ෂ නායකතුමා සාකච්ඡාවක් තිබූ බවත්, එහිදී දෙමළ ජනතාවගේ ඉල්ලීමක් අනුව පලාත් සභා මැතිවරණය පැවැත්විය යුතුයි කියා අදහසක් පැමිනි බවත්, අහැලියගොඩ සිටින පුරවැසියන් විදිහට අපි සියලුම දෙනා ම ඇහැලියගොඩ ජනතාව විදිහට පලාත් සභා මැතිවරණය ඉතාම කෙටි කාලයක් තුළ පවත්වා, සමීක්ෂණ වාර්තාවලින් ඔබතුමාලට 75% ක ප්‍රතිශතයක් තිබෙන බව වාර්තා වී ඇති බවත්, ඒ සඳහා ගරු කරන බවත්, පළාත් සභා මැතිවරණය පැවත්වීමට අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාට ශක්තිය ධෛර්ය ලාබේවා කියා ප්‍රාර්ථනා කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

යම් වැඩපිළිවෙළක් තුළ ගරු සභාපතිතුමා සද්භාවයෙන් ගන්නා වූ තීන්දුවලට සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවත්,එහි කිසිදු ගැටලුවක් නොමැති බවත්, සමුපකාර ඡන්දයේදී ගරු සභාපතිතුමා ඔබතුමාගේ භූමිකාව සිදු කළ බවත්, සමගි ජනබලවේගය ඇතුළු සියලු පක්ෂ ඒකරාශි කරගෙන පොදු විපක්ෂයක් ලෙස ජයග්‍රහණය කර පෙන්නු බවත්, ඒ සඳහා එක් වූ සියලුම දේශපාලන අධිකාරියට ගෞරවනීය ප්‍රණාමය පුද කරමින්, ගරු සභාපතිතුමා ලෙන යන වැඩපිළිවෙලට සමන් දෙවියන්ගේ ආශිර්වාදය පුද කරමින් තමාගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ප.ව 12.57 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් මතු කළ කාරණය ග්‍රාමීය දේශපාලනය තුළ මතු වූ පොඩි අර්බුදයක් වැනි සිදු වීමක් බවත්, මේ වන විට ඇහැලියගොඩ සභා බල ප්‍රදේශයේ වසම් 44 තුළ විශාල වැඩ කොටසක් සිදු කර ඇති බවත්, ඒ සඳහා ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන හා අමාත්‍යාංශ ප්‍රතිපාදන හා පළාත් පාලන ප්‍රතිපාදන යන සෑම අංශයන්ගෙන් ම ලැබී ඇති බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා ප.ව 12.58 ට සභා ගර්භයෙන් පිට විය.

ව්‍යාපෘතිය සිදු කිරීමට වඩා මුදලක් එම ව්‍යාපෘතියේ ඵළකය ගැසීම සඳහා කලින් පැවැති ආණ්ඩු විසින් සිදු කළ බවත්, කෝටි දෙකක මුදලකින් නැදුරන බතල කොටුව මාර්ගය සම්පූර්ණයෙන් ම සැකසූ බවත්, නමුත් කිසිදු බෝර්ඩ් එකක් එම ස්ථානයේ ප්‍රදර්ශනය නොකළ බවත්, සම්ප්‍රධායක් විදියට මේ ආණ්ඩුව මන්ත්‍රීවරුන්ගේ නම් ප්‍රදර්ශනය කිරීමට සුදානමක් නොමැති බවත්,එය තම පක්ෂය එදා සිට පවත්වාගෙන යන ප්‍රතිපත්තියක් බවත්, 2018 තමන් පසුගිය සභාව නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් බවත්, එම කාලයේ දී ආදාහනාගාරය සම්බන්ධ ව්‍යාපෘතියේ ඵළකයේ තමාගේ නම

සඳහන් නොකළ බවත්, එය තමන්ගේ කැමැත්ත අනුව සිදු කළ බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ, අගමැතිතුමියගේ, අමාත්‍ය සුනිල් සෙනවි මැතිතුමාගේ, සභාපතිතුමාගේ, ප්‍රාදේශිය සභා මන්ත්‍රීගේ, කොට්ඨ සභා නිලධාරීන්ගේ, ඡයා රූප පළ නොකළ යුතු බවත්,පෙර පැවැති ආණ්ඩු කාලයේ පෙර ව්‍යාපෘති පළකවල මුද්දර ප්‍රමාණයේ ඔළු 20 ක් පමණ තිබෙන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එසේ නොකර ව්‍යාපෘතියේ නම, මූලික ඇස්තමේන්තුව, වැඩ අවසන් ගෙවීම් වාර්තාව, වැනි අත්‍යවශ්‍ය කාරණා සඳහන් කරමින් දැන්වීම් පුවරුවක් ස්ථාපිත කළ යුතු බවත්, නැතහොත් ග්‍රාමීය දේශපාලනය තුළ පවතින කෙනිත්තිලි නිසා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණියට මෙන් අපහසුතාවයට පත්වීමට සිදු වන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභා ප්‍රතිපාදන මඟින්, පළාත් සභා ප්‍රතිපාදන මඟින්, අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් සිදු කරන ව්‍යාපෘති සඳහා අදාළ ව්‍යාපෘතියේ විස්තර ඇතුළත් කර දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කළ යුතු බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රී පැහැදිලි කිරීම්වලදී වැරදි ප්‍රකාශ කිහිපයක් කළ බවත්,සමුපකාර ඡන්දයේ අවසාන ප්‍රතිඵලය කුමක් ද යන්න ඉදිරියේ දී දැන ගැනීමට හැකි වන බවත්, සැම මන්ත්‍රීවරයෙක් ම මේ වන විට වසම්වල වැඩ කටයුතු සිදු කර ඇති බවත්,සමහර වසම්වල වෙනත් පක්ෂවල මන්ත්‍රීවරුන් සිටින බවත්, එවැනි අවස්ථාවල කොට්ඨාශයේ මන්ත්‍රීතුමා හෝ මන්ත්‍රීතුමිය අපහසුතාවයට පත් විය හැකි බවත්, එමනිසා ජනතාවට වැරදි අවබෝධයක් නොවන ආකාරයට, විශේෂයෙන් ම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් සිදු කරන ව්‍යාපෘති සඳහා වුවත් ලොකු මුදලක් වැය නොකර කුඩා දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කළ යුතුය යන අදහස ඉදිරිපත් කරන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ප.ව 01.03 ට නැවත සභාවට පැමිණෙන ලදී

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා ප.ව 01.03 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

2026.08.11 වන සභා න්‍යාය පත්‍රය සඳහා ඇතුළත් කිරීමට ඉදිරිපත් කළ යෝජනා 3 ම නිතිමය කරුණු පදනම් කරගෙන ඉවත් කිරීමට කටයුතු කර ඇති බවත්, එය ගැටලුවක් නොමැති බවත්, සමහරවිට තමාගේ අක්ෂර වින්‍යාශයේ ගැටලුවක් කියා සිතන බවත්, ඇහැලියගොඩ ජාතික පාසල හා ප්‍රාදේශිය සභාවයි අතර පවත්නා නීතිමය ගැටලුව සම්බන්ධව තමන් එහිදී ප්‍රශ්න කළ බවත්, ඒ සම්බන්ධව නිසි පිළිතුරක් මේවන තෙක් ලැබී නොමැති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් චික්‍රමසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා ප.ව 01.05 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා ප.ව 01.05 ට නැවත සභාවට පැමිණෙන ලදී

පනාවල මාර්ගයේ කාණුවක් සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, එම යෝජනාව ප්‍රතික්ෂේප වීමට හේතුව ලෙස යොජනාව ඉදිරිපත් කළ කාරණාව සම්බන්ධව මෙතෙක් පැමිණිල්ලක් ලැබී නැත කියා ලිපියක් මගින් දන්වා ඇති බවත් එතුමා විසින් සඳහන් කරන ලදී.තමා මෙම යෝජනාව ඉදිරිපත් කළේ පැමිනිල්ලක් පැමිණිමට පෙර බවත්, අවශ්‍ය නම් පැමිණිලි එවන්නට හැකි බවත්, පැමිණිලි ලැබීමට පෙර මැදිහත් වෙයි කියා අදහසින් මෙය යොමු කළ බවත්, තමා එවූ යෝජනාව පැමිණිල්ලක් ලෙස ගැනිමට නොහැක්කේ කුමන හේතුවකින් ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

අංක 3 යෝජනාව, යෝජනාවෙන් ඉදිරිපත් වී කාරණය සම්බන්ධව මෙතෙක් කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැති බවත්, මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය නම් කාර්මිකසේවා කාරක සභාව වෙත විධිමත්ව යොමු කළ යුතුය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා ප.ව 01.09 ට නැවත සභාවට පැමිණෙන ලදී

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ආදාහනාගාරයේ සේවකයින් දෙදෙනෙක් සිටින බවත්, ඒ සම්බන්ධව පැමිණිල්ලක් ලැබී නොමැති බව එයින් දන්වා ඇති බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් පැහැදිලි කරන්නට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ආදාහනාගරය සම්බනධව නෙමේ මේ කියන්නේ.දෙවැනි යෝජනාව වශයෙන් තමා ඉදිරිපත් කළ යෝජනාව ගැන මේ අවස්ථාවේ ප්‍රකාශ කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

අවමංගල්‍ය රථයකින්වත් මේ වන තෙක් පැමිණිල්ලක් ලැබී නැති බවත්, ඒ සම්බන්ධව කාර්මික සේවා කාරක සභාවට යොමු කරන ලෙස දන්වමින් ඔබතුමාට ලිපියක් මඟින් දනවා ඇති බවත්, එය යෝජනාවක් ලෙස නැවත කාර්මික සේවා කාරක සභාවට යොමු කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා ප.ව 01.13 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා ප.ව 01.13 ට නැවත සභාවට පැමිණෙන ලදී

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මහා සභාවේ මන්ත්‍රිතුමා ප්‍රකාශ කළ විට එය කාර්මික සේවා කාරක සභාවට යොමු කිරීමට කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය ප.ව 01.14 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මන්ත්‍රිතුමා යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ මහජන පැමිණිලි ලැබුණ බව සඳහන් කරමින් බවත්, නමුත් එසේ පැමිණිලි සභාවට හෝ ආදාහනාගාර සේවකයන් වෙත ලැබී නොමැති බව ලිපියෙන් මන්ත්‍රිතුමාව දැනුවත් කළ බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

මන්ත්‍රිතුමා මන්ත්‍රිතුමාට එවා ඇති ලිපිය සම්පූර්ණ ම සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

“ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ සාමාන්‍ය සභා රැස්වීම් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම - 2026 අගෝස්තු මාසය. ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ 2026.08.11 වන දින පැවැත්වෙන සාමාන්‍ය සභා රැස්වීම් නයාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලද 2026.07.30 වන දිනැති ලිපිය හා යොමු වේ. එම ලිපිය මඟින් අංක 1,2 හා 3 යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා, පහත සඳහන් හේතූන් මත 2026.08.11 වන දින සභා රැස්වීම් න්‍යාය පත්‍රය සඳහා අදාළ යෝජනා ඇතුළත් කළ නොහැකි බව කාරුණිකව දන්වමි.අංක 1 යෝජනාව, යෝජනාවක් ආකාරයෙන් නොමැති බැවින් විධිමත් යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ යුතුය.අංක 2 යෝජනාව, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇත.අංක 3 යෝජනාව, යෝජනාවෙන් ඉදිරිපත් වී කාරණය සම්බන්ධව මෙතෙක් කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැති බවත්, මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය නම් කාර්මිකසේවා කාරක සභාව වෙත විධිමත්ව යොමු කළ යුතුය.”

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මන්ත්‍රීතුමා, පැහැදිලිව ඔබතුමාව දැනුවත් කර තිබෙන බවත්, කාර්මික සේවා කාරක සභාවට විධිමත්ව යෝජනාව ලබා දෙන ලෙස දන්වා ඇති බවත්, එය ප්‍රතික්ෂේප කිරීමක් නොවන බවත්, කාර්මික සේවා කාරක සභාවේ මේ සම්බන්ධව සාකච්ඡාවක් සිදු කර සභාවට දැමීම සුදුසු බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මේ යෝජනාව පිළිගෙන, මෙම යෝජනාව කාර්මික සේවා කාරක සභාවට යොමු කර පිළිතුරක් ලබා දෙන ලෙසට ගරු සභාපතිතුමා විසින් යොමු කළ යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

කොහිලදෙනිය ප්‍රදේශයේ කාණුව සම්පූර්ණයෙන් වැසී ඇති බවත්, අවස්ථා කිහිපයක දීම ඒ සම්බන්ධව දැනුවත් කිරීම් කළත් ඒ සම්බන්ධව නිසි පිළියමක් යොදා නොමැති බවත්, එම ස්ථානයේ ආබාධිත පුද්ගලයෙකු ලොතරැයි කුඩුවක් ද පවත්වාගෙන යන බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය ද මැදිහත් කර ගනිමින් මේ කටයුතු සිදු කර ගැනීමට නොහැකි වුවහොත් එහි අපකීර්තිය පවතින රජයට ලැබෙන බවත්, ඒ සඳහා විශේෂ අවධානය යොමු කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.එත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය ප.ව 01.15 ට සභා ගර්භයෙන් පිට විය

ප්‍රාදේශිය සභාවේ ජලය බැහැර කරන ක්‍රමවේදයෙහි ගැටලුවක් මතු වී ඇති බවත්, බොහෝ තැන් අබලන් වී ඇති බවත්, එහි නිසි ක්‍රමයට ජලය බැස නොයන බවත්, වර්ෂාව ඇති විටෙක අවස්ථාවලදී පහළ වහනයක් නවත්වා බැස යාමට නොහැකි තත්ත්වයක් ඇති වී ඇති බවත්, එම නිසා වැසි ජලය බැස යන පිලි පද්ධතිය ක්‍රමවත් කිරීමට අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොළ භූමියේ විශාල සංවර්ධන කටයුත්තක් සඳහා සංවර්ධන කාර්යක් කිරීමට කටයුතු සංවිධානය වී ඇති බවත්, එහෙත් වෙළඳ මහතුන් සමඟ නිසි සාකච්ඡාවකට යොමු වීමක් සිදු වී නැති බවත්, සංවර්ධන යෝජනා අඛණ්ඩව සිදු කිරීමට වෙළෙඳුන් සමඟ යම් එකඟතාවයකට පැමිණීමේ ක්‍රමවේදයකට යොමු වන ලෙසට ඉල්ලීමක් කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොළ භූමියේ පවතින මාර ගස කපා ඉවත් කිරීමට සැලසුම් කිරීම සම්බන්ධව ස්තුතිවන්ත බව බවත්, ගලිවලවල් වල යකඩ ආවර්ණ ඉවත් වී ඇති බවත්, මේ සම්බන්ධව සැම සභා වාරයක දීම දැනුවත් කිරීම් කළ බවත්, ඒ සම්බන්ධවත් මැදිහත් වීමක් සිදු කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොළ භූමියේ පවතින ගස බැමීමට ආසන්නව ඇති බවත්, ගස මැරුනොත් හෝ ගස කඩා වැටුණ හොත් බැමීමද කැඩී යන බවත්, මේ සම්බන්ධව මින් පෙර කරුණු දැක්වීමේදී ප්‍රතිපාදන ලැබී ඇති බව ප්‍රකාශ කළ බවත්,ඒ සම්බන්ධව ඉක්මනින් ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කළ බවත්, ඒ සම්බන්ධව ද විශේෂ අවධානය යොමු කරන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ආදාහනාගාරයේ නැවත මාන වැවී ඇති බවත්, මාන ගලවා ඉවත් නොකර ඒ සඳහා කොපමණ පිලියම් යෙදුවද ප්‍රයෝජනයක් නොවන බව ද ඒ සඳහා වෙනත් තාක්ෂණික ක්‍රමවේදයක් යොදා ගෙන එම මාන පඳුරු ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා ප.ව 01.18 ට සභා ගර්භයෙන් පිට විය.

මෝරගල සමුපකාර සමිතියේ ඡන්දය සඳහා තමා ඒ ස්ථානයට නොගිය බවත්, තමාට ලැබුණු තොරතුරක් අනුව මෙම ප්‍රකාශය සිදු කරන බවත්, එහි ඡන්ද පෙට්ටිය තබනවා කියා ප්‍රකාශ කල ස්ථානයේ නොව වෙනත් ස්ථානයක ඡන්ද පෙට්ටිය තබා තිබූ බවත්, ඡන්ද අපේක්ෂකයෙකුගේ නිවසේ ඡන්ද පෙට්ටිය තබා තිබූ බවත්, එහි විනිවිද භාවයේ ගැටලුවක් පවතින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අපි වවාගෙන කනවා කියන සංකල්පයක් නැති බව ගරු ලාල්කාන්ත ඇමතිතුමා ප්‍රකාශයක් කළ බවත්, එවිට ගොවියෝ කියනවා අපි ඡන්දෙ දීලා ඉල්ලන් කනවා කියලා.(ඝෝෂාව) මෙය කාටුන්වල ගිය ප්‍රකාශයක් බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය ප.ව 01.19 ට නැවත සභාවට පැමිණෙන ලදී

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

ඇහැලියගොඩ පොලිසියේ නිලධාරීන් 272 ක් සිටිය යුතු බවත්, පොලිස් කොස්තාපල් තනතුරේ නිලධාරීන් 194 ක් සිටිය යුතු බවත්,දැනට 13 දෙනෙකු පමණක් සිටින බවත්, දැනට සිටින සමස්ත නිලධාරීන් පිරිස 79 දෙනෙකු බවත්, මේ සම්බන්ධව සොයා බලා කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

යම් පුද්ගලයෙක් පොලිස් පැමිණිල්ලක් දැමූ බවත්, ඒ සම්බන්ධව ක්‍රියාත්මක නොවූ හෙයින් ඒ පිලිබඳ සොයා බැලීමේ දී මෙම තොරතුරු දැන ගැනීමට ලාබුණු බවත්, එම පැමිණිල්ල සම්බන්ධව අද දින ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පොලිස් ස්ථානය ගංවතුරට යට වෙන බවත්, පොලිසිය ගොඩනැගිලි සංවර්ධනය කළ යුතු වුවත් ඒ සම්බන්ධව නඩු කටයුත්තක් සිදුවන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා ප.ව 01.23 ට නැවත සභාවට පැමිණෙන ලදී

දෙවැනි මහලේ වැසිකිලි පද්ධතියේ අවුරුදු 15 සිට විදුලිය නොමැති බවත්,ඒ බව තමා දැනුවත් වුයේ ද සමාජ මාධ්‍ය මඟින් බවත්, එය නිවරදි කිරීමට කටයුතු කළ බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සමුපකාර නිලවරණය සඳහා විපක්ෂයේ මන්ත්‍රිවරු විශාල වශයෙන් යොමු වී එම කටයුතු සිදු කළ බවත්,පක්ෂයේ මන්ත්‍රිවරුන් හා ඇමතිවරුන් ඒ සඳහා යොමු නොවූ බවත්, (සෝෂාව) තමාගේ ඡන්දය පත්ඛේරිය උතුර ප්‍රදේශයේ තිබූ බවත්, එය තමාගේ පළමු ඡන්දය බවත්,තමන් සහය දැක්වූ පත්ඛේරිය උතුර, පත්ඛේරිය දකුණ දික්දෙනිය .. ආදිය සියලුම ප්‍රාදේශික ජයග්‍රහණය කළ බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සමුපකාර ඡන්දයේ ජය පරාජය ජනතාවට භරියට දන්නැති බවත්, සභාපති හා විධායක අධ්‍යක්ෂක මණ්ඩලය ඇතුළු 07 දෙනාම පත් වන්නේ ජාතික ජනබලවේගයෙන් බව තමා ඉතා විශ්වාසයෙන් ප්‍රකාශ කරන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අද දින සභා රැස්වීම සඳහා පැමිණි ගරු මන්ත්‍රිවරුන් මන්ත්‍රිවරියන් සියලු දෙනාටමත්, මාධ්‍යවේ දී සියලු දෙනාටත්, සභා ලේකම්තුමා ඇතුළු නිලධාරීන් දෙපළටත් ස්තුතිවන්ත වන බවත්,2026.08.11 වන සාමාන්‍ය සභා රැස්වීමේ කටයුතු මේ සමඟ අවසන් කරන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.08.11 වන දින සාමාන්‍ය සභා රැස්වීම 1.25 ට නිමාවට පත් විය.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ක් වූ.....මස.....දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.